# රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල ගෘහ භාණ්ඩ නිෂ්පාදන යන්ත්‍රාගාරයේ කාර්යසාධනය - 2010



කාර්ය සාධන හා පරිසර
විගණන ඒකකය

# 2013
# ජුනි

විගණකාධිපති දෙපාර්තමේන්තුව

## 01. විධායක සාරාංශය.

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංසථා පනත යටතේ රාජ්‍ය දැව සංස්ථාව 1968 අප්‍රේල් මස සංස්ථාපනය කරන ලදී. එහි දැක්ම වනුයේ ඉතාමත් විශ්වාසවන්ත සහ අනර්ඝ තත්ත්වයේ දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන ජාතියට සැපයීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීමයි. සංයුක්ත ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රට පුරා ජාලගත කර ඇති දැව කම්හල් 13 කින්, දැව පදම් කිරීමේ යන්ත්‍ර 04 කින්, ලී බඩු නිෂ්පාදන වැඩපළවල් 03 කින් සහ අලෙවිසැල් 32 කින් රා. දැ. සංස්ථාව සන්නද්ධව සිටී.

රා. දැ. සංස්ථාවට කල්දෙමුල්ල, අම්පාර සහ බූස්ස ලී බඩු නිෂ්පාදන කම්හල් තුනක් අයත් වේ. කල්දෙමුල්ල ලී බඩ නිෂ්පාදන කම්හල එහි නිෂ්පාදන ක්‍රියාවලිය 1981වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, 2000 වර්ෂයේ සිට ගෘහාශ්‍රිත ලී බඩු විෂයයන් නිෂ්පාදනය කිරීම් ආරම්භ කරන ලදී. කෙසේවෙතත්, ආරම්භයේ සිටම මෙම කම්හල පාඩු පිට පවත්වාගෙන යන ඒකකයක්ව පැවතුණි. එබැවින් කල්දෙමුල්ල කම්හල කාර්යසාධන විගණනය සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරා ගන්නා ලදී.

විගණනයේ ප්‍රධානතම අරමුණු වන්නේ කල්දෙමුල්ල කම්හලේ මෙහෙයුම් කටයුතු අනාගතයේදී වාණිජමය හා මූල්‍යමය ස්ථාවරත්වයක් පවත්වාගෙන යාම සඳහා කාර්යක්ෂමව ඵලදායකව හා අරපිරිමැසුම් ආකාරයෙන් පවත්වාගෙන යන්නේද යන්න ගැන තක්සේරුවක් කිරීම සහ මෙම කම්හලේ කාර්යයන් පරිසරයට අවාසි සහගත බලපෑම් නොකෙරෙන ආකාරයෙන් පවත්වාගෙන යන්නේද යන්න තහවුරු කර ගැනීමයි.

විගණනය 2010 ජූලි සිට 2010 ඔක්තෝබර් කාල පරිච්ඡේදය ඇතුළතදී සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. විගණනයට ලිඛිත සාක්ෂි රැස් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණය, භෞතික සත්‍යාපන සහ නිරීක්ෂණ ඇතුලත් විය. වැදගත් විගණන සොයා ගැනීම්වල සාරාංශයට පහත සඳහන් කරුණු ඇතුළත් වේ. ප්‍රධාන ලීබඩු උපකරණ විෂයයන්වල විකුණුම් මිල ගණන් වර්තමාන වෙළෙඳපල මිල ගණන් වලට වඩා පහළ අගයක් ගැනීම, ලීබඩු උපකරණ විෂයයන්වල ප්‍රමිත පිරිවැය නිරවද්‍ය නොවීම සහ ඒවා බොහෝ කාලයකින් සංශෝධනය කර නොතිබීම, යන්ත්‍ර ප්‍රශස්ත විකුණුම් මිශ්‍රණයෙන් මෙහෙයවා නොතිබීම, අලෙවිකරණ ක්‍රමෝපායන් සහ සැලැස්මක් නොපැවතීම, ප්‍රදර්ශනාගාර, ගණුදෙනුකරුවන් සිත් ඇදගන්නා ස්වරූපයෙන් සකස් නොවීම, කල්දෙමුල්ල කම්හල සඳහා මනා බඳවා ගැනීමේ සැලැස්මක් නොවීම, කාර්ය මණ්ඩලය ප්‍රමාණවත්ව පුහුණු නොකිරීම, මෙහෙයුම් මනාව සම්බන්ධීකරණය හා නියාමනය නොවීම, ද්‍රව්‍ය අපතයන්, නිශ්කාර්ය ශ්‍රමය හා යන්ත්‍ර පැය සැපයුම් ලැයිස්තු පිළියෙල කිරීමේදී පදම්කරන යන්ත්‍රය සහ ඉරුම් මෝල අතර සම්බන්ධීකරණය නොතිබීම, වටිනා සහ භාවිතා කළහැකි ඉරූ දැව දර ලෙස පාවිච්චි කිරීම, අමුද්‍රව්‍ය අරපිරිමැසුම් රහිතව ප්‍රසම්පාදනය කිරීම, මනා තත්ත්ව පරීක්ෂාවක සහ තහවුරුවක් නොමැතිවීම, ඉල්ලුමක් නැතව ලීබඩු උපකරණ විෂයයන් කම්හල් වලින් නිෂ්පාදනය කිරීම, මනා තොග වාර්තා පවත්වා

නොතිබීම, ඵලදායී නොවන ලෙස ඉඩම් හා ගොඩනැගිලි භාවිතය, පරිසරයට හානිකර නිෂ්පාදන ක්‍රියාවලිය, කාලීන කළමනාකාරිත්ව තොරතුරු නොමැතිවීම සහ රා. දැ. සංස්ථාව විසින් සංයුක්ත පාලන මාර්ගෝපදේශ වලට අනුකූල නොවීමයි.

වෙනත් දැ සමඟ විගණන නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ. තරඟකාරී වෙළෙඳපොල මිල සහ ප්‍රමිත පිරිවැය ව්‍යුහය සලකා බැලීම සඳහා නිරවද්‍ය මිල කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම, විකුණුම් පද්ධතියක් හඳුන්වාදීම සහ හස්ත පරිපාටි ඉවත් කිරීම සඳහා මිල කිරීම සහ ඉන්වොයිසි පරිපාටිය ස්වයංකීය කිරීම, පවත්නා සම්පත් තුළ වඩාත් ඵලදාය නිෂ්පාදන මිශ්‍රණයක් හඳුනා ගැනීම, උචිත අලෙවි යාන්ත්‍රණයක් සහ ගණුදෙනුකරුවන් වඩාත් ඇදගන්නා ස්ථානයක් ලෙස ප්‍රදර්ශනාගාර ඇතුළත යටිතල පහසුකම් හඳුන්වාදීම, ප්‍රදර්ශනාගාර කාර්යමණ්ඩලයට හා කම්හල් සේවකයන්ට විධිමත් පුහුණුවක් සපයාදීම, නයාමනය සහ ක්‍රමෝපාය තීරණ ගැනීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වාදීම, පවතින සම්පත් උපරිමයෙන් භාවිතා කිරීම සඳහා කර්මාන්තශාලාවට මනා නිෂ්පාදන සැලැසමක් තිබීම, කාර්යයන් සැලසුම් කිරීමට හා නියාමනයට ප්‍රධාන කළමනාකරුවන් සහභාගිවීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට හා අපතයන් අවම කිරීමට එස් - 5 පද්ධතිය හඳුන්වාදීම, ප්‍රසාද දීමනා ක්‍රමයක් හඳුන්වාදීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලවීම, පවත්නා බඳවා ගැනීමේ පරිපාටිය තරයේම පුහුණු හා අත්දැකීම් සහත සේවකයන් බඳවා ගැනීමට පටිපාටියක් භාවිතා කළයුතුවීම, තත්ත්ව පාලන ක්‍රියාවලියක් හඳුන්වාදීම, සංයුක්ත පාලන මාර්ගෝපදේශ වලට අනුකූල වීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගැනීම, බිම් ජලය දූෂ්‍යවීම වැළැක්වීම සඳහා දැව පදම් කිරීමේ භූමිය, පදම් කළ දැව බිම් ප්‍රදෙශය සහ කීල් තාර (ක්‍රියෝ සොට් තෙල්) බැරල් ගබඩා ප්‍රදේශය විධිමත්ව සිමෙන්ති දැමීම, රෙගුලාසි වලට අනුකූලව අපද්‍රව්‍ය (ලීකුඩු) බැහැර කිරීම, කර්මාන්තශාලාව තුළ ප්‍රමාණවත් ආලෝකය හා වාතාශ්‍රය සැපයීම සහ සේවක ආරක්ෂක ආම්පන්න සැපයීම, කර්මාන්තශාලාවේ දැව අවශ්‍යතාව මනාව සැලසම් කිරීම, සැලැස්මට අනුකූලව දැව ඉරීම, කල්තබා ගැනීම හා කැපීම කාර්යක්ෂමව හා ඵලදායක ලෙස නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවීම, පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ තොග ලේඛනය පවත්වාගෙනයාම සඳහා මනා පද්ධතියක් හඳුන්වාදීමේ අවශ්‍යතාව, බොයිලේරුවට දර ලෙස පාවිච්චි කිරීමට පෙර දැව වර්ග කිරීමේ මනා ක්‍රමවේදයක් හඳුන්වාදීම.

## 02. හැඳින්වීම.

### 2.1 පසුබිම

රාජ්‍ය දැව සංස්ථාව (රා.දැ.ස.) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1968 වර්ෂයේ අප්‍රේල් මාසයේදී ස්ථාපිත කරන ලදී. එයට වන සම්පත් අස්වනු කිරීමේ වගකීම පැවරෙන රාජ්‍ය ආයතනය වීමට සහ එම සම්පත් දැව සහ ලීබඩු කර්මාන්තයට හා ශ්‍රී ලංකාවේ මහජනතාවට අවශ්‍ය ද්‍රව්‍යයන් බවට පරිවර්තනය කිරීමට අධිකාර බලය පාර්ලමේන්තු පනතින් පවරාදී ඇත. රා. දැ. සංස්ථාව පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

හිඟ සම්පතක් බවට වැඩිවෙමින් පවතින දැව උපයෝජනය උපරිම කිරීමේ නවීන කර්මාන්ත උපනතියට සමගාමීව දැව කර්මාන්තය මෙහෙයවීම සංවර්ධනය කිරීමේ වගකීම රා. දැ. සංස්ථාවට පැවරී ඇති අතර, එම මෙහෙයුම් කටයුතුවල යෙදෙන්නන්ගේ සහ කර්මාන්තයේ යෙදෙන වෙනත් අයගේ ඵලදායිතාව ඉහළ නැංවීමේ වගකීමද පැවරී ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ දැක්ම වනුයේ වඩාත් විශ්වාසදායක හා උසස් තත්ත්වයේ දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන සැපයීමේ ප්‍රමුඛයා බවට පත්වීම වන අතර, එහි මෙහෙවර වනුයේ දැනුම සහ කාලයක් තිස්සේ ලබාගත් පුහුණුව ඔස්සේ ගණුදෙනුකරුවන්ට දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සහ ශ්‍රී ලංකාවේ ජාතික හා පාරිසරික ඉල්ලුමට දායකවීමයි.

සාමුහික අභිමතාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව ඉරුම් මෝල් 13 කින්, දැව පදම් කිරීමේ යන්ත්‍රාගාර 4 කින්, ලීබඩු උපකරණ නිෂ්පාදන කර්මාන්තශාලා 3 කින් ප්‍රාදේශීය කාර්යාල 13 කින්, අලෙවිසැල් 32 කින් සහ නියෝජිත පොළවල් 2 කින් යුතුව දිවයින පුරා මෙහෙයුම් ජාලයක් සහිතව මනාව සන්නද්ධ වී සිටි.

**කල්දෙමුල්ල සංකීර්ණයේ ව්‍යුහය**

කල්දෙමුල්ල සංකීර්ණයේ ප්‍රධාන මෙහෙයුම් වනුයේ දැව කඳන් විකිණීම, දැව, ඉරූ දැව බවට පරිවර්තනය කිරීම, ඉරූ දැව විකිණීම, නිමි ද්‍රව්‍ය නිෂ්පාදනය හා විකිණීම, දැව සංයෝගය, සුරක්ෂණය සහ කල්තබා ගැනීම වේ.

**කල්දෙමුල්ල සංකීර්ණයේ ඉතිහාසය සහ වර්තමාන තත්ත්වය ඇඟයීම.**

කල්දෙමුල්ල වැඩපොළ එහි නිෂ්පාදන ක්‍රියාවලිය 1981 වර්ෂයේදී යන්ත්‍ර 4 කින් ආරම්භ කරන ලදී. අනතුරුව, 1986 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මාරු කරන ලද යන්ත්‍ර 30 ක් භාවිතා කරමින් කාර්යාල ලීබඩු නිෂ්පාදනය කිරීම දක්වා යන්ත්‍රාගාරය පුළුල් කරන ලදී. 2000 වර්ෂයට පෙර

රා. දැ. සංස්ථාව බාහිර කොන්ත්‍රාත්කරුවන්ගෙන් ගෘහ භාණ්ඩ මිලදීගෙන විකුණන ලදී. 2000 වර්ෂයේ සිට රා. දැ. සංස්ථාව ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලදී.

වර්තමානයේදී ලීබඩු කර්මාන්තශාලාවේ සේවකයෝ 60 ක්ද, රත්මලාන ප්‍රදර්ශනාගාරයේ සේවකයෝ 05 දෙනෙක්ද, සේවයේ යෙදී සිටිති. ඊට අතිරේකව, අවශ්‍ය අවස්ථා වලදී වඩුකාර්මිකයන් පින්තාරු කරන්නන් සහ වේවැල් කාර්මිකයන් කොන්ත්‍රාත් පදනම යටතේ කුලියට ගනු ලැබේ.

## 2.2 විගණනය සඳහා අධිකාර් බලය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව විගණකාධිපති මූල්‍ය විගණනයට වඩා පුළුල්ව රාජ්‍ය අංශයේ ආයතනවල ගණුදෙනුවල, වැඩසටහන්වල සහ කාර්යන්වල අරපිරිමැසුම් බව, කාර්යක්ෂමතාව, ඵලදායිත්වය සහ පාරිසරික යන අංශ තක්සේරු කිරීම ඉලක්ක කරගත් කාර්යසාධන විගණනයන්ද ආවරණය කරයි. මෙයින් ඉලක්ක කරන්නෙ රාජ්‍ය අංශයේ පරිපාලනය හා ගිණුම්දීමේ වගකීම වැඩිදියුණු කිරීමයි.

ඒ අනුව කල්දෙමුල්ල ලීබඩු නිෂ්පාදන කර්මාන්තශාලාවේ කාර්යසාධන විගණනය විගණකාධිපතිගේ ව්‍යවස්ථාමය රාජකාරි යටතේ ක්‍රියාත්මක කරන ලදී.

## 2.3 තෝරා ගැනීමේ අවශ්‍යතාව සහ හේතු.

රාජ්‍ය අංශයේ ආයතනවල සහ පොදු ජනතාවගේ ලීබඩු අවශ්‍යතා ඉටුකරදීම සඳහා රා. දැ. සංස්ථාව යටතේ වෙනම ඒකකයක් ලෙස කල්දෙමුල්ල කර්මාන්තශාලාව ස්ථාපනය කරන ලදී. කෙසේවෙතත්, ආරම්භයේ සිටම මෙම කර්මාන්තශාලාව වාණිජමය හා මූල්‍යමය ශක්තියක් සහිතව පවත්වාගෙන ගොස් නොතිබුණි.
2007 වර්ෂයේ සිට දැරූ පාඩු ඉකුත් වර්ෂ හා සැසඳීමේදී කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. 2007, 2008 සහ 2009 වර්ෂවල මූල්‍ය ප්‍රකාශවල සාරාංශයක් පහත දැක්වේ.

| | 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය ශ්‍රී ල.රු. මිලියන | 2008 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය ශ්‍රී ල.රු. මිලියන | 2007 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය ශ්‍රී ල.රු. මිලියන |
|---|---|---|---|
| විකුණුම් | 21.7 | 22.9 | 22.8 |
| අඩු : විකුණුම් පිරිවැය | (25.3) | (8.6) | (23.8) |
| දළ ලාභය/(පාඩුව) | (3.6) | 14.3 | (1.0) |
| පරිපාලන පරිවැය | (25.4) | (25.3) | (20.0) |
| වෙනත් පිරිවැය | - | - | - |
| ශුද්ධ පාඩුව | (29.0) | (11.0) | (21.0) |

## 2.4 විගණන විෂය පථය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ කාර්යසාධන විගණනය සිදුකරන ලද අතර, අපට අවශ්‍යයැයි සැලකෙන පරීක්ෂණයන්ද ඊට ඇතුළත් විය. කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ මෙහෙයුම් හා අභ්‍යන්තර පාලන පද්ධති, (ප්‍රකාශිත අරමණු සාක්ෂාත් කර ගැනීමට වන බලපෑම නිශ්චය කර ගැනීමේ පදනමක් ලෙස යොදා ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට) හඳුනා ගන්නා ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධ අවදානම් පිළිබඳ අවබෝධයක් අප විසින් ලබාගත් අතර, අපගේ කාර්යසාධන විගණනයේ සොයා ගැනීම් හා නිර්දේශයන් පිළිබඳ නිගමන වලට එළඹෙන ලදී.

1. සාධාරණ නිගමන වලට එළඹීමට හැකිවන පිණිස ප්‍රමාණවත් යැයි අප සළකනු ලැබූ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට අපි අපේක්ෂා කළෙමු. කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වැළැක්වෙන අවදානම හා ආශ්‍රිත කාර්යයන් පිළිබඳ අපගේ තක්සේරුව අනුව, අපගේ පරිපාටිවල ස්වභාවය හා ප්‍රමාණය වෙනස් විය හැකිය. අපගේ සොයා ගැනීම් හා නිර්දේශ වලට උපකාරී වන සාක්ෂි පරීක්ෂා කිරීම්ද (මූල්‍ය/විමර්ශන විගණනයට අදාළ වියහැකි) අපගේ පරිපාටි වලට ඇතුළත් වේ.

2. අපගේ විගණන වැඩ කල්තබා සැලසුම් කර විගණන සැලැස්මකට ඇතුළත් කරන ලදී. කාර්යසාධන විගණනය කරගෙන යන අතරතුර අපේ සොයාගැනීම් පදනම් කරගෙන මෙය වෙනස් විය. ඒ අනුව අපගේ විගණන විෂය පථය වෙනස් කිරීමට අපට සිදුවූ අතර, අවස්ථාවෝචිතව විශේෂ අවධානය යොමු කළයුතු කරුණු යෝජනා කිරීමට සිදුවිය.

3. කල්දෙමුල්ල කර්මාන්තශාලාවට අදාළව හඳුනාගත් අරමුණු පමණක් අපගේ කාර්යසාධන විගණනය ආවරණය කරන ලද අතර, එයට රා. දැ. සංස්ථාවේ හා ලීබඩු නිෂ්පාදන කාර්මාන්තශාලාවේ මූල්‍ය ප්‍රකාශ විගණනයද ඇතුළත් විය.

## 2.5 විගණන ප්‍රවේශය, අරමුණ සහ නිර්නායක

විගණනයට ප්‍රවේශය පහත පරිදි වේ.

- ඉරුම් මෝල, පදම් කිරීමේ යන්ත්‍රාගාරය, වැඩපල සහ ප්‍රදර්ශනාගාරයේ මෙහෙයුම් නිරීක්ෂණය කිරීම්.
- විවිධ ස්වාධීන ප්‍රභවයන්ගෙන් ලබාගත් දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම සහ ඒවා කර්මාන්තශාලාව සමඟ සැසඳීම සහ
- අනෙකුත් අදාළ ලේඛනගත කිරීම් සමාලෝචනය සහ අදාළ කාර්ය මණ්ඩලය සම්මුඛ සාකච්ඡා වලට භාජනය කිරීම.

  විගණනයේ ප්‍රධාන අරමුණු වනුයේ,
- කල්දෙමුල්ල කර්මාන්තශාලාව අනාගතයේදී වාණිජමය හා මූල්‍යමය ශක්තියකින් පවත්වාගෙන යාම සඳහා එවැනි මෙහෙයුම් කාර්යක්ෂමව, ඵලදායී සහ අරපිරිමැසුම් ආකාරයෙන් කරනු ලැබේද යන්න සහ,
- කර්මාන්තශාලාවේ කටයුතු පරිසරයට අහිතකර බලපෑමක් නොකෙරෙන ආකාරයෙන් සිදු කරන බවට සහතිකවීම තක්සේරු කිරීමයි.

**විගණන නිර්නායක**

විගණන සොයාගැනීම් සහ නිර්දේශ පදනම් කරගනු ලබන නිර්නායක පහත දැක්වේ.

1. තෝරාගත් ලීබඩු විෂයයන් සම්බන්ධයෙන් කර්මාන්තශාලාවේ ලාභයට උපරිමයෙන් දායකවිය හැකි විකුණුම් මිල.

2. තෝරාගත් ලීබඩු විෂයයන් සම්බන්ධයෙන් කර්මාන්තශාලාවේ ලාභයට උපරිමයෙන් දායකවිය හැකි පරිමාව.

3. කර්මාන්තශාලාවේ පූර්ව විනිශ්චය කරන ලද ප්‍රමිත සහ ස්වාධීනව ලබාගත් ප්‍රමිත වලට අනුකූලව තෝරාගත් ලීබඩු උපකරණ වලට උපයෝජනය කරගත් ප්‍රධාන සම්පත්.

4. අපේක්ෂිත නේවාසික කාලපරිච්ඡේදයට එරෙහිව තෝරාගත් ලීබඩු විෂයයන්වල නේවාසික කාල පරිච්ඡේදය.

5. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ ඒවා කම්හල කළමනාකරණය විසින් ක්‍රියාත්මක කිරීම.

6. ඉරු දැව, දූවිල්ල සහ අබලි ද්‍රව්‍ය අපහරණය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය සකස් කරන ලද මාර්ගෝපදේශ/ප්‍රතිමාන සහ කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ ඒවා අපහරණය කිරීමේ පරිචය

## 2.6 සීමා කිරීම්, විරල බැහැරවීම් සහ පිළයම

මෙම විගණනය සැලසුම් කිරීමේදී සීමාකිරීම් අවම කිරීමට උත්සාහ කරන ලදී. කෙසේවෙතත්, මෙම විගණනයේ විෂය පථය ඉක්ම වූ සමහර සීමාකිරීම් තිබුණි. මෙම විගණනය මාස හතරක කාලයකට පමණක් සීමාවී තිබුණු අතර, මෙම කාලය තුළ කාර්යමණ්ඩලය ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු ද ඉටු කරන ලදී. විගණන කණ්ඩායමට අවශ්‍ය වූ සමහර තොරතුරු කර්මාන්තශාලාවේ කාර්ය මණ්ඩලය තුළ සූදානම්ව නොතිබණි. සමහරවිට ඔවුන්ගේ කාර්යබහුල කාර්ය සටහන උපලේඛනය හේතුකොටගෙන වැඩි දින ගණනක් රැඳී සිටීමට සිදුවිය. එබැවින්, එකී තොරතුරු ලැබෙන තෙක් විගණන කාර්ය මණ්ඩලයට වෙනත් වැඩ ආරම්භ කිරීමට සිදු විය. වෙනත් ප්‍රධාන සීමා කිරීමක් වුයේ කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිවීමෙන් නිෂ්පාදන ක්‍රියාවලියේදී උපයෝජනය කරන ලද තථ්‍ය සම්පත් සෘජුව හඳුනාගත නොහැකි වූ බැවින් නිෂ්පාදන ක්‍රියාවලියේදී උපයෝජනය කරන ලද තථ්‍ය දැව හා ශ්‍රමය සහ යන්ත්‍ර පැය ප්‍රමාණය විගණන කණ්ඩායමට ගණනය කිරීමට සිදු වීමය. දැව තොග පිළිබඳ වාර්තා නොමැතිවීම හේතුවෙන්, දැව පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ පැවැති තොග සත්‍යාපනය කිරීමට විගණන කණ්ඩායමට වෙන් කරන ලද කාලයට වැඩි කාලයක් ගත කිරීමට සිදු විය.

කාර්යසාධනයට මිණුම් වශයෙන් පදනම් කරගත් භාවිතා කරන ලද විස්තරාත්මක වැඩ විෂය පථය, අරමුණු සහ විගණන නිර්නායක මෙම වාර්තාවේ "අ" පරිශිෂ්ඨයෙහි දැක්වේ.

## 1 කොටස

## 03. විගණන නිරීක්ෂණ හා නිර්දේශ

### 3.1 මූල්‍ය ස්ථායිතාව පවත්වාගෙන යාම සඳහා මිල තීරණය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රමාණවත් නොවීම.

**නිරීක්ෂණය**


අප විසින් තෝරාගත් විෂයයන් කීපයක විකුණුම් මිල ගණන් රජයේ ආයතන වලින් හා පුද්ගලික ආයතනයකින් ලබා ගන්නා ලදී. ඒ අනුව තරඟකරුවන්ගේ විකුණුම් මිල ගණන් සහ කර්මාන්තශාලාවේ විකුණුම් මිල ගණන් අතර වෙනස්කම් සටහන් කර ගන්නා ලදී.

1. රජයේ ආයතන 1 (G 1- 1)
2. රජයේ ආයතන 2 (G 1- 2)
3. පුද්ගලික ආයතන (P 1)

තෝරාගත් විෂයයන්වල විකුණුම් මිල ගණන සඳහා පහත සඳහන් වගුව සහ ප්‍රස්තාරය බලන්න.

| | ලී බඩු විෂයය | කල්දෙමුල්ල කර්මාන්තශාලාව (ශ්‍රී ල.රු.) | (G 1- 1) (ශ්‍රී ල.රු.) | (G 1- 2) (ශ්‍රී ල.රු.) | (P 1) (ශ්‍රී ල.රු.) |
|---|---|---|---|---|---|
| 1. | දේශනශාලා පුටුව- ග්‍රෑන්ඩිස් | 2,653 | 5,222 | 3,550 | 4,000 |
| 2. | හාන්සි පුටුව - ග්‍රෑන්ඩිස් | 2,228 | 9,000 | 3,100 | 3,600 |
| 3. | ලිපිකරු මේසය - ග්‍රෑන්ඩිස් | 10,591 | 14,000 | 12,100 | 12,600 |
| 4. | කණිෂ්ඨ විධායක මේසය - ග්‍රෑන්ඩිස් | 14,479 | 20,000 | 16,400 | 19,000 |
| 5. | තනි ඇඳ - තේක්ක | 18,525 | 18,000 | 17,000 | 20,500 |
| 6. | සාමාන්‍ය පුටුව - ග්‍රෑන්ඩිස් | 1,944 | 8,300 | 2,800 | 3,300 |
| 7. | ද්විත්ව ඇඳ - තේක්ක | 22,700 | 22,000 | 22,100 | 27,500 |
| 8. | සාමාන්‍ය මේසය - ග්‍රෑන්ඩිස් | 7,527 | 14,000 | 7,250 | 11,000 |
| 9. | කුෂන් කළ රැස්වීම්ශාලා පුටුව - තේක්ක | 5,617 | 9,000 | 6,250 | 7,000 |
| 10. | කෑම කාමර පුටු - තේක්ක | 4,038 | 7,500 | 5,100 | 7,000 |

කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ විකුණුම් මිලගණන් වෙනත් තරඟකාර මිල ගණන් සමඟ සැසඳීම.




ඉහත සඳහන් වගුව හා ප්‍රස්තාරය අනුව සියළුම විෂයයන්වල කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ මිල ගණන් අනෙකුත් ආයතනවල මිල ගණන් වලට වඩා පහළ අගයක් පෙන්වයි.

විකුණුම් මිල ගණන් කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ සියළු තරඟකරුවන්ට වඩා අඩුවෙන් පැවතුණත් එහි තරඟකාරීත්වය වැඩිදියුණු කර නොමැති බව අවධාරණය කළ යුතුය.

**ඇගැයීම**

විකුණුම් මිල ගණන් නිෂ්පාදන පිරිවැය සහ වෙනත් අදාළ පිරිවැය ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවීම හේතුකොටගෙන කල්දෙමුල්ල කර්මාන්තශාලාව පාඩු ලබමින් පවතින අතර, වෙළෙඳපොළ මිල ගණන් වලට සහ ප්‍රවර්තන පිරිවැය ව්‍යුහයට අනුකූලව මිල නියම කිරීමට අපොහොසත්වී ඇත.

**නිර්දේශය**

තරඟකාරී මිල ගණන් සහ කර්මාන්තශාලාවේ පිරිවැය ව්‍යුහය යන කරුණු දෙකම සැලකිල්ලට ගෙන තාත්වික මිල කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදිය යුතුය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

කල්දෙමුල්ල කර්මාන්තශාලාවේදී නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමෙන් පසු එය ප්‍රධාන කාර්යාලයේ පිහිටි මිල කමිටුව වෙත යොමු කෙරේ. නිෂ්පාදන පිරිවැය සහ වෙළෙඳපොළ උපනතිය සැලකිල්ලට ගෙන මිල කමිටුව අවසාන මිල ගණන් නියම කරයි. අනතුරුව පිරිවැය ක්‍රියාවලිය මධ්‍යගත කිරීම සඳහා රාජ්‍ය දැව සංසථාව විසින් ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (E R P System) හඳුන්වා දෙනු ලබයි.

## 3.2 ප්‍රමිත පිරිවැය ව්‍යුහය, තථ්‍ය වියදම් රටාව සමඟ පවත්වාගෙන නොයයි.

**නිරීක්ෂණ**

කල්දෙමුල්ල කර්මාන්තශාලාව තවමත් භාවිතා කරන්නේ 1992 වර්ෂයේදී පෞද්ගලික උපදේශක සමාගමක් විසින් සංවර්ධනය කරන ලද ප්‍රමිත පිරිවැය ක්‍රමයකි. උදාහරණයක ලෙස උපදේශක වාර්තාව මගින් නිශ්චය කරන ලද පහත සඳහන් පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ රේට් ගණන්, සමච්ජේද ලක්ෂයට ළඟාවීමට ප්‍රමාණවත් නොවීය.

- කම්හල් පොදු කාර්ය - ඝන ඩේ.මී එකට ශ්‍රී ල.රු.3.37 බැගින්
- කැපීම හා සැලසුම් කිරීම - ඝන ඩේ.මී එකට ශ්‍රී ල.රු.3.53 බැගින්
- යන්ත්‍ර පිරිවැය - ඝන ඩේ.මී එකට ශ්‍රී ල.රු.2.50 බැගින්

ඊට අමතරව ඩේ.මී එකකට පදම් කිරීමේ පිරිවැය (ශ්‍රී ල.රු.4.10) ඉකුත් වර්ෂ පහ තුළදී සංශෝධනය කර නොතිබුණි.

වසර 18 කට පෙර සංවර්ධනය කරන ලද ප්‍රමිත පිරිවැය භාවිතා කරගෙන කර්මාන්තශාලා විකුණුම් මිල නිශ්චය කළත් සමහර ලීබඩු උපකරණ විෂයයන් විකුණා තිබු තථ්‍ය විකුණුම් මිල ගණන්, පහත වගුවේ උදාහරණ වලින් දැක්වෙන පරිදි ප්‍රමිත විකුණුම් මිල ගණන් වලට වඩා සැළකිය යුතු ලෙස පහළ අගයක් ගෙන තිබුණු අවස්ථා අපි නිරීක්ෂණය කළෙමු.

ඉහත (3.1) ඡේදයෙන් නිරීක්ෂණය කළ පරිදි කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ ප්‍රවර්තන විකුණම් මිල ගණන් වෙළෙඳපොළ තරඟකරුවන්ගේ මිල ගණන් වලට වඩා බෙහෙවින් පහළ අගයක් ගෙන තිබුණි.

| | ලී බඩු, උපකරණවිෂයයන් | ප්‍රමිත පිරිවැය පත්‍රිකා අනුව විකුණුම් මිල (ශ්‍රී ල.රු.) | තථ්‍ය විකුණුම් මිල (ශ්‍රී ල.රු.) | වෙනස (ශ්‍රී ල.රු.) |
|---|---|---|---|---|
| 1. | දේශනශාලා පුටව - ග්‍රාන්ඩිස | 3,242 | 2,653 | 589 |
| 2. | හාන්ස පුටු - ග්‍රාන්ඩිස් | 3,045 | 2,228 | 817 |
| 3. | ලිපිකරු මේස - ග්‍රාන්ඩිස් | 11,394 | 10,591 | 803 |
| 4. | කණිෂ්ඨ විධායක මේස - ග්‍රාන්ඩිස් | 18,865 | 14,479 | 4,386 |
| 5. | තනි ඇඳ - තේක්ක | 18,823 | 18,525 | 298 |
| 6. | සාමාන්‍ය පුටුව - ග්‍රාන්ඩිස් | 2,762 | 1,944 | 818 |
| 7. | ද්විත්ව ඇඳ - තේක්ක | 28,450 | 22,700 | 5,750 |
| 8. | සාමාන්‍ය මේසය - ග්‍රාන්ඩිස් | 6,756 | 7,527 | (771) |
| 9. | සම්මන්ත්‍රණ කුෂන් පුටුව - තේක්ක | 4,553 | 5,617 | (1,064) |
| 10. | කෑම කාමර පුටුව - තේක්ක | 4,629 | 4,038 | 591 |

විෂයයන් 8 සහ 9 හැර අනෙකුත් සියළුම විෂයයන් ප්‍රමිත විකුණුම් මිලට වඩා අඩුවෙන් විකුණා තිබුණි.

**ඇගැයීම**

කල්දෙමුල්ල කර්මාන්තශාලාව, විකුණුම් මිල නිශ්චය කිරීම සඳහා එක් එක් ලීබඩු විෂයයන්වල ප්‍රමිත පිරිවැය මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කරයි. දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමිත පිරිවැය සංශෝධනය නොකිරීම මෙන්ම ප්‍රමිත විකුණුම් මිලට අනුරූපව ලීබඩු නොවිකිණීම හේතුකොටගෙන කර්මාන්තශාලාව එහි ලීබඩු පාඩුපිට විකුණයි.

**නිර්දේශ**

- වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් වලට අනුකූලව ප්‍රමිත පිරිවැය ව්‍යුහය සංශෝධනය කළයුතු අතර, ප්‍රවර්තන පිරිවැය ව්‍යුහය හා තරඟකාරී වෙළෙඳපොළ මිල ගණන් සැලකිල්ලට ගෙන ලීබඩු විකුණුම් මිල ගණන් නියම කළ යුතුය.

හස්ත පර්පාටි (කර්මාන්තශාලාව දැනට අනුගමනය කරන) ඉවත් කිරීම සඳහා කල්දෙමුල්ල කර්මාන්තශාලාව එහි විකුණුම් පද්ධතිය හඳුන්වාදීම සළකා බැලිය යුතු අතර, මිල කිරීම හා ඉන්වොයිසි පර්පාටිය ස්වයංක්‍රීය කර කාර්යක්ෂමතාව වැඩිකළ යුතුය.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

රාජ්‍ය දැව සංස්ථාව මීට පෙර කුපර්ස් පද්ධතිය පදනම් කර ගෙන එහි ලී බඩු පිරිවැයකරණය කරන ලද. දැනට ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ඊආර්පී පද්ධතිය) පිරිවැයකරණය සඳහා හඳුන්වාදී තිබේ.

## 3.3 කල්දෙමුල්ල කර්මානතශාලාව සමච්ඡේද ලක්ෂය කරා ළඟාවීම සඳහා විකිණීමට අවශ්‍ය ලී බඩු විෂයයන් පරිමාව.

**නිරීක්ෂණය**

කල්දෙමුල්ල කර්මාන්තශාලාව සමච්ඡේද ලක්ෂය කරා ළඟාවීම නිශ්චය කිරීම සඳහා (ලාභ හෝ පාඩු නොමැති) තෝරාගත් ලීබඩු උපකරණ විෂයයන් 10 ක ගණනය කිරීම පහත දැක්වේ.

එක් අවස්ථාවකදී එක් විෂයයක් පමණක් නිෂ්පාදනය කරනු ලැබේ යන උපකල්පනය මත මෙම පරිමාවන් ගණනය කරනු ලැබේ.

| | දේශන-ශාලා පුටුව | හාන්සි පුටුව | ලිපි-කරු මේසය | කණිෂ්ඨ විධායක මේසය | තනි ඇඳ | සාමාන්‍ය පුටුව | ද්විත්ව ඇඳ | සාමාන්‍ය මේසය | කුෂන් කල සම්මන්ත්‍රණ ශාලා පුටුව | කැම කාමර පුටුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒකක විකුණුම් මිල | 2,653 | 2,228 | 10,591 | 14,479 | 18,525 | 1,944 | 22,700 | 7,527 | 5,617 | 4,038 |
| අඩු කළා : | | | | | | | | | | |
| ඒකක විචල්‍ය පිරිවැය | (1,775) | (1,557) | (6,465) | (11,404) | (14,913) | (1,197) | (23,496) | (8,135) | (2,033) | (2,685) |
| ඒකක දායකය | 878 | 671 | 4,126 | 3,075 | 3,612 | 747 | (796) | (608) | 3,584 | 1,353 |
| පරිමාව | 6,772 | 8,860 | 1,441 | 1,934 | 1,646 | 7,962 | * | * | 1,659 | 4,395 |
| ස්ථාවර පිරිවැය | (5,945,957) | (5,945,957) | (5,945,957) | (5,945,957) | (5,945,957) | (5,945,957) | | | (5,945,957) | (5,945,957) |
| සමච්ඡේදය | 0 | 0 | 0 | 0 | 0 | 0 | | | 0 | 0 |

(*) ද්විත්ව ඇඳ හා සාමාන්‍ය ඇඳක විකුණුම් මිල එම විෂයයන්ගේ විචල්‍ය පිරිවැයට වඩා අඩුවීම හේතුකොටගෙන ඒවාහි සමච්ඡේද පරිමාව ගණනය කිරීමට අපට නොහැකි විය.

2009 වර්ෂයේ තථ්‍ය විකුණුම් පරිමාව සමච්ඡේද පරිමාව සමඟ සැසඳීමේදී තථ්‍ය පරිමාව සමච්ඡේද පරිමාවට වඩා බෙහෙවින් අඩු අගයක් ගත් බව පහත සටහනෙන් පැහැදිලි වේ. ඒ හේතුවෙන් කර්මාන්තශාලාවට සැලකිය යුතු පාඩු සිදුවිය.

2009 වර්ෂයේ සමච්ඡේද පරිමාව තථ්‍ය පරිමාව සමඟ සසදා පහත වගුවෙන් දැක්වේ.

| | විෂයය | සමච්ඡේදවීමට නිපදවිය යුතු පරිමාව ඒකක | තථ්‍ය නිෂ්පාදන පරිමාව (2009) ඒකක | වෙනස ඒකක |
|---|---|---|---|---|
| 1. | දේශනශාලා පුටුව | 6,772 | 2,227 | 4,545 |
| 2. | හාන්සි පුටුව | 8,860 | 967 | 7,893 |
| 3. | ලිපිකරු මේසය | 1,441 | 152 | 1,289 |
| 4. | කණිෂ්ඨ විධායක මේසය | 1,934 | 98 | 1,836 |
| 5. | තනි ඇඳ | 1,646 | 26 | 1,620 |
| 6. | සාමාන්‍ය පුටුව | 7,962 | 203 | 7,759 |
| 7. | ද්විත්ව ඇඳ | 7,469 | 16 | 7,453 |
| 8. | සාමාන්‍ය මේසය | 9,782 | 34 | 9,748 |
| 9. | කුෂන් කළ සම්මන්ත්‍රණශාලා පුටුව | 1,659 | 44 | 1,615 |
| 10. | කෑම කාමර පුටුව | 4,395 | 54 | 4,341 |

**ඇගයීම**

ධනාත්මක දායකයක් උත්පාදනය කළහැකි උචිත ලීබඩු විෂයයන් මිශ්‍රණයක් තෝරා ගැනීමට අපොහොසත්වීම සහ සමච්ඡේද ලක්ෂයට ඉහළින් පරිමාවක් නිෂ්පාදනය නොකිරීම හේතුවෙන් කල්දෙමුල්ල කර්මාන්තශාලාව වසර ගණනාවක් පාඩු ලබමින් තිබුණි.

**නිර්දේශය**

පවත්නා සම්පත් සීමාවන් තුළ (ශ්‍රමය යන්ත්‍ර ආදිය) කර්මාන්තශාලාව ව්‍යාපාරයට ධනාත්මක දායකත්වයක් සපයන වඩාත් ලාභදායක නිෂ්පාදන මිශ්‍රණයක් සහ තෝරාගත් විකුණුම් මිශ්‍රණයට වෙළෙඳපොළ ඉල්ලුමක් හඳුනාගත යුතුය.

**රා.දැ. සංස්ථා ප්‍රතිචාරය**

සංස්ථාව, කල්දෙමුල්ල ඇතුළු සියළුම සංකීර්ණ සඳහා වාර්ෂිකව නිෂ්පාදන සැලැස්මක් පිළියෙල කරයි. මෙම සැලැස්ම පිළියෙල කිරීම සඳහා ඉක්මණින් අලෙවි වන ගෘහ සහ කාර්යාල ලීබඩු උපකරණ නිෂ්පාදනයට ප්‍රමුඛත්වය දීම සැලකිල්ලට ගන්නා අතර, අනතුරුව වෙනත් ලීබඩු උපකරණ විෂයයන් මිශ්‍රණයක් තෝරා ගනී. අපගේ සීමිත සම්පත් හා වෙළෙඳපොළ උපනතිය ගත්විට වාර්තාවේදී යොජනා කර ඇති සමච්ඡේද පරිමාව යථාරූපී නොවේ. ස්ථාවර සහ අනෙකුත් විචල්‍ය පිරිවැය අඩු කරමින් යෝජිත සමච්ඡේද පරිමාව අඩු කිරීම මඟින් ලාභදායත්වයක් ඇති කර ගැනීම සඳහා රා. දැ.සංස්ථාව මහත් පරිශ්‍රමයක් දරනු ඇත.

<u>11 කොටස</u>

## 3.4 ප්‍රදර්ශනාගාරයේ පිහිටීම සහ භෞතික යටිතල පහසුකම් පිළිගත හැකි ප්‍රමිතියකට නොවීම.

**නිරීක්ෂණ**

ප්‍රදර්ශනාගාරය ගණුදෙනුකරුවන් මන බඳින ආකාරයෙන් පිහිටා නැති බවත්, එහි පෙනුමට වැට වලින් හා ගස් වලින් බාධාවී ඇති බවත් අපි නිරීක්ෂණය කළෙමු.

ප්‍රදර්ශනාගාරය සම්බන්ධයෙන් කරන ලද නිශ්චිත නිරීක්ෂණයන්ගේ ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රදර්ශනාගාරයේ පෙනුම ගණුදෙනුකරුවන් පිනවන ආකාරයෙන් නොවුණු අතර, ගොඩනැගිල්ලේ ඉදිරිපස වැටකින් හා ගස් වලින් ආවරණයවී තිබූ හෙයින් ගාලු පාර දිගේ පැමිණෙන භව්‍ය ගණුදෙනුකරුවන්ට ප්‍රදර්ශනාගාරයේ පෙනුමට බාධාවී තිබුණි.



- ප්‍රදර්ශනාගාරය ඉදිරිපිට කැපීපෙනෙන දර්ශනීය නාම පුවරුවක් හෝ කටවුට්ටියක් ප්‍රදර්ශනය කර නොතිබුණි.



- ඇතුළත වාතාශ්‍රය ආලෝකය සහ ගෘහභාණ්ඩ ප්‍රදර්ශනය වැනි දෑ සතුටුදායක මට්ටමකට සකස් කර නොතිබුණි. ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරය පුරාම විසුරුවා තිබූ අතර, ඒවා නව ගණුදෙනුකරුවන්ගේ සිත් ඇදගන්නා ස්වරූපයෙන් ප්‍රදර්ශනය කර නොතිබුණි.



## 3.5 ප්‍රදර්ශනාගාරයේ සීමා කරන ලද කාර්යාල වේලාවන්

- ප්‍රදර්ශනාගාරය සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.30 දක්වාත් සෙනසුරාදා දිනවල පෙ.ව.8.00 සිට ප.ව. 1.00 දක්වාත් මෙහෙයුම් කටයුතු සිදු කරයි.

බොහෝ ගණුදෙනුකරුවන් සතියේ දිනවල සහ විශේෂයෙන් සති අන්තයේ ප්‍රමාදවී සාප්පු සවාරි යාමට වඩා කැමැත්තක් දක්වන හෙයින් ප්‍රදර්ශනාගාරයේ සීමිත මෙහෙයුම් පැය ගණන් නිසා වැඩිපුර ගණදෙනුකරුවන් ප්‍රදර්ශනාගාරයට ආකර්ෂණය කර ගැනීමට බාධාවක්වී තිබුණි.

**ඇගවීම**

උසස් සංවිධානයක් සහිතව ගෘහ භාණ්ඩ වෙළදාමේ දී කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ ප්‍රදර්ශනාගාරයේ පවතින දුර්වල පිහිටීම, දර්ශනය හා යටිතල පහසුකම් (ආලෝකය, වාතාශ්‍රය වැනි ) කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ තරඟකාරිත්වයට අවාසි සහගතව බලපා තිබුණි.

**නිර්දේශ**

- ප්‍රදර්ශනාගාරය, ගණුදෙනුකරුවන් සත් ගන්නා ආකාරයේ ස්ථානයක් බවට පත්කිරීම සඳහා කර්මාන්තශාලාවට උචිත අලෙවි ක්‍රමෝපායන් හා අවශ්‍ය යටිතල පහසුකම් හඳුන්වා දිය යුතුය.
- බොහෝ ගණුදෙනුකරුවන් සාප්පු යාම සතියේ දිනවල කාර්යාල වේලාවෙන් පසු සහ සති අන්ත විවේක කාලය තුළ කිරීමට වඩා කැමති හෙයින් ප්‍රදර්ශනාගාරයේ මෙහෙයුම් පැය ගණන් දීර්ඝ කළ යුතුය.
- කල්දෙමුල්ල ප්‍රදර්ශනාගාරයේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය දියුණු කිරීම සඳහා තරඟකරුවන්ගේ ප්‍රදර්ශක ක්‍රමෝපායන් අධ්‍යයනය කළ යුතුය.

- පහත දැක්වෙන ඡායාරූපවලින් මනාව සැකසූ දීප්තිමත් ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර, පිළිවෙලක් නොමැතිව කල්දෙමුල්ල ප්‍රදර්ශනාගාරයේ ප්‍රදර්ශනය කර තිබූ ගෘහ භාණ්ඩ සමඟ සසඳා දැක්වේ.





**රා.දැ.සංස්ථා ප්‍රතිචාරය**

කලාත්මක නව ප්‍රදර්ශනාගාරයක් ඉදිකිරීමට සහ අවට පරිසරය ඇතුළුව පවත්නා ප්‍රදර්ශනාගාරය උසස් කිරීමට රාජ්‍ය දැව සංස්ථාව 2013 අයවැය ලේඛනය මගින් අරමුදල් වෙන් කර ඇත. නිෂ්පාදනවල ඡායාරූප සහ මුද්‍රිත ප්‍රදර්ශනාගාර, අසම්පූර්ණ ඡායාරූප නිසා සත්‍ය තත්ත්වය පෙන්නුම් නොකරයි. යෝජනා කරන ලද පරිදි රාජ්‍ය දැව සංස්ථාව ප්‍රදර්ශනාගාරය විවෘතව තබන වේලාවල් දීර්ඝ කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

## 3.6 කල්දෙමුල්ල කර්මාන්තශාලාව මනා අලෙවි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**නිරීක්ෂණය**

කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ අලෙවි කටයුතු රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවි අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. කෙසේවෙතත්, රාජ්‍ය දැව සංස්ථාවට හෝ කර්මාන්තශාලාවට අලෙවි සැලැස්මක් නොමැති බව අපි සටහන් කරමු. කල්දෙමුල්ල කර්මාන්තශාලාවට යොමු කරන ලද වෙනම සැලැස්මක් වෙනුවට රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවි අංශය විසින් සංවර්ධනය කරන ලද ක්‍රියාකාර සැලැස්මක් භාවිතා කරමින් සිටී.

**ඇඟවීම**

ව්‍යාපාරයේ ප්‍රධානතම කොටසක් වන්නේ ලිඛිත සර්ව සම්පූර්ණ අලෙවි සැලැස්මයි. එයින් කර්මාන්තශාලාව ගණුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම හා රඳවා ගැනීම විස්තර කරන අතර, කර්මාන්තශාලාව එහි විකුණුම් වැඩිදියුණු කිරීමට මාර්ගෝපදේශ සපයයි.

කල්දෙමුල්ල කර්මාන්තශාලාවට එයටම අයත් අලෙවි සැලැස්මක් තිබුණහොත් ලැබෙන සමහර වාසි පහත දැක්වේ.

මනා ව්‍යුහාත්මක අලෙවි සැලැස්ම.

- පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා ඕනෑකම් හඳුනා ගැනීම.
- නිෂ්පාදනවල ඉල්ලුම නිශ්චය කිරීම.
- පහසුවෙන් සතුටු කළ නොහැකි ගණුදෙනුකාර ඉල්ලුමට සරිලන නිෂ්පාදන සැලැසුම් කිරීමට සහායවීම.
- දෛනික මෙහෙයුම් සඳහා මුදල් ඉපැයීම, ණය ආපසු ගෙවීමට හා ලාභයක් ඉපැයීමට පියවරවල් සැලසුම් කිරීම.
- තරඟකරුවන් හඳුනා ගැනීම, නිෂ්පාදන විශ්ලේෂණය කිරීම සහ ඔවුන්ගේ තරඟකාරී වාසි හඳුනා ගැනීම.
- නව නිෂ්පාදන ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
- නව සහ හෝ ශක්තිමත් පාරිභෝගිකයන් හඳුනා ගැනීම.
- ක්‍රමෝපායන් අපේක්ෂිත ප්‍රතිඵල නිපදවනවා නම් ඒ සඳහා පරීක්ෂා කිරීමට ඉඩ හැරීම.

අලෙවි සැලැස්මක් නොමැතිවීම හේතුවෙන් ඉහත සඳහන් වාසි වලින් කර්මාන්තශාලාවට ලැබිය හැකි ප්‍රතිලාභ නැති විය හැකිය.

**නිර්දේශ**

කල්දෙමුල්ල කර්මාන්තශාලාව සහ රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවි අංශය විශේෂයෙන්ම කර්මාන්තශාලාව සඳහා සර්ව සම්පූර්ණ අලෙවි සැලැස්මක් සංවර්ධනය කර එකී සංවර්ධනය කරන ලද අලෙවි සැලැස්මට අනුකූලව අලෙවි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

කල්දෙමුල්ල සංකීර්ණයේ අලෙවි කටයුතු රා. දැ. සංස්ථාවේ අලෙවි අංශය විසින් කරනු ලබයි. යෝජනා කරන ලද පරිදි, කල්දෙමුල්ල කර්මාන්තශාලාවට විශෙෂයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා රා.දැ. සංස්ථාව පූර්ණ අලෙවි සැලැස්මක් සංවර්ධනය කරනු ඇත.

## 3.7 ප්‍රවර්ධන ව්‍යාපාර සහ ප්‍රචාරණ ක්‍රම

**නිරීක්ෂණ**

- රා.දැ. සංස්ථාව 2010 වසරේ අප්‍රේල් මාසයේදී දැව සංස්ථා සේවකයන්ට සහ අනෙකුත් රාජ්‍ය අංශයේ සේවකයන්ට " ප්‍රසාද අභිමානි "නමින් ලීබඩු උපකරණ පැකේජයක් හඳුන්වාදී ඇති බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපාරයේ ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා රා. දැ. සංස්ථාව ශ්‍රී ලංකා රුපියල් 468,270 ක් වැය කර තිබුණි. මෙකී පැකේජය යටතේ 2010 අප්‍රේල් 06 දින සිට 2010 අගෝස්තු 14 දින දක්වා විකුණුම් වටිනාකම රු.1,548,430 ක් විය.

- "ප්‍රසාද අභිමානී" පැකේජයේ ඇතුලත් නොවූ ශ්‍රී ලංකා රුපියල 505,551 ක් වටිනා ලීබඩු විෂයයන් සියයට10 ක විශේෂ වට්ටමක් දෙමින් මෙම පැකේජය යටතේ විකුණා තිබූ බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

**ඇඟවීම්**

* පැකේජය යටතේ ප්‍රක්ෂේපිත විකුණුම් සමඟ අනුරූප නොවන ප්‍රචාරණ වියදම් දැරීම පාඩු ලැබීමට බලපෑ හැකිය.

* "ප්‍රසාද අභිමානි" පැකේජය තුළ නොමැති ලීබඩු උපකරණ වට්ටමක් සහිතව විකිණීමෙන් ආදායම අහිමිවීම.

**නිර්දේශය**

ප්‍රක්ෂේපිත විකුණුම් වලට අනුකූලව ප්‍රචාරණ වියදම් අරපිරිමැසුම්දායක කිරීම සහ ගණුදෙනුකරුවන්ට පැකේජ ප්‍රදානය කිරීමේදී එකී පැකේජයේ අන්තර්ගතය සම්බන්ධයෙන් කළමනාකාරීත්වය තීරණ වලින් බැහැර නොවීම.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

2010 වර්ෂයේ සට අපි ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් රාශියක් ආරම්භ කළෙමු.

- ප්‍රසාද අභිමානී පැකේජය පහසු ගෙවීමේ ක්‍රමය යටතේ රු.200,000 ක සීමාවකට රාජ්‍ය දැව සංස්ථාව සහ රාජ්‍ය අංශයේ සේවකයන්ට ලීබඩු අලෙවිකිරීමේ ප්‍රවර්ධන වැඩසටහනකි.

- පළමු වතාවට සංස්ථාවේ ලීබඩු මාලදිවයිනේ ප්‍රදර්ශනය කරන ලද අතර, එහිදී පාර්භෝගිකයන් විශාල සංඛ්‍යාවක් ආකර්ශනය කරගත් අතර, සියළුම ප්‍රදර්ශන භාණ්ඩ අලෙවි කර ලීබඩු සැපයීමේ ඇනවුම් ලබා ගතිමු.
- ගණුදෙනුකරුවන් රාශියකගේ ඉල්ලීම පිට සිල්ලරට ලීබඩු මිලදී ගන්නා විට විද්‍යුත් ණය කාඩ්පත් (credit cards) පිළිගැනීමට තීරණය කර ඇත.මෙයින් වෙළඳපොල වැඩි කර ගැනීමට අපේක්ෂා කරමු.
- ප්‍රචාරණ හා ප්‍රවර්ධන කටයුතු ක්ෂණිකව ප්‍රතිඵල ගෙන නොදෙන අතර, එය පල දැරීමට කාලයක් ගත වේ.

## 3.8 ප්‍රදර්ශනාගාර සේවකයන් පුහුණුකිරීමේ අවශ්‍යතාව.

**නිරීක්ෂණය**

කල්දෙමුල්ල කර්මාන්තශාලාව රත්මලානේ පිහිටි ප්‍රදර්ශනාගාරය සඳහා ගණුදෙනුකාර සම්බන්ධතා සහ විකුණුම් කටයුතු වෙනුවෙන් නිලධාරීන් 6 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. එහෙත් එම කිසිදු නිලධාරියෙකුට ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හා සම්බන්ධ ගණුදෙනුකාර සම්බන්ධතා, විකුණුම්, අලෙවි හා අනෙක් කාර්යයන් පිළිබඳව පුහුණුවක් ලබාදී නොතිබුණි.

සාර්ථක ව්‍යාපාරයකට ගණුදෙනුකරුවන් සමඟ සම්බනධතා අනුන වූ විකුණුම් ක්‍රමෝපායන් ආදිය ගැන පුහුණුව ලබාදීම අත්‍යවශ්‍ය ලක්ෂණයකි. එවැන්නක් නොමැති වූ විට එය ප්‍රදර්ශනාගාරයේ කාර්යසාධනයට අවාසි සහගතව බලපායි. ප්‍රදර්ශනාගාරයට යොදවන කාර්ය මණ්ඩලයට ගණුදෙනුකරුවන් සමඟ සම්බන්ධතා අනුන විකුණුම් ක්‍රමෝපායන් හා ප්‍රදර්ශනාගාර කළමනාකරණය ගැන පුහුණුව ලබාදිය යුතුය.

**ඇඟවීම**

ගණුදෙනුකරුවන් සමඟ සෘජුව සම්බන්ධ වන කාර්ය මණ්ඩලයට පුහුණුව නොමැතිවීම හේතුකොටගෙන ගුණාත්මක නොවූ සේවාවක් හා දුර්වල ගණුදෙනුකාර සම්බන්ධතාවකට ඉඩ සැලසේ. අවසානයේ එය ප්‍රදර්ශනාගාරයේ කාර්යසාධනයට බලපායි.

**නිර්දේශය**

ප්‍රදර්ශනාගාරයට අනුයුක්ත සියළුම කාර්ය මණ්ඩලයට විධිමත් පුහුණුවක් ලබාදිය යුතුය.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

ලී වැඩවල යෙදී සිටන සේවකයන්ගේ කාර්යභාරය හා තත්ත්වය ප්‍රවර්ධනය කිරීම හා උසස් කිරීම රාජ්‍ය දැව සංස්ථාවේ ඉලක්කයයි. මේ සඳහා ආධුනිකයන් හා පුහුණු සේවකයන් පුහුණු කිරීමට අපට පුහුණු අංශයක් ඇත. රා. දැ. සංස්ථාව සෑම වර්ෂයකම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල් වෙන් කරයි. 2011 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව ඉහළ සුදුසුකම් ඇති ලීබඩු උපකරණ සැලසුම් ශිල්පියෙකු කල්දෙමුල්ල සංකීර්ණයට පත්කර/අනුයුක්ත කර ඇත. ඔහු ප්‍රදර්ශනාගාරයේ කටයුතු පිළියෙල කිරීම හා පුහුණුව ගැන වගබලා ගනු ඇත.

## 3.9 තථ්‍ය සම්පත් උපයෝජනය හඳුනාගැනීමේ පද්ධතිය

**නිරීක්ෂණය**

කල්දෙමුල්ල සංකීර්ණයට කාලීනව කළමනාකාරිත්ව තොරතුරු ලබා ගැනීමේ මනා පද්ධතියක් නොමැති බව අපි නිරීක්ෂණය කළෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් දැව, ශ්‍රමය, යන්ත්‍ර සහ අනෙකුත් කර්මාන්තශාලාව නිෂ්පාදනය කරන ලීබඩු විෂයන්වල ඍජු හා වක්‍ර පිරිවැය පිළිබඳ සත්‍ය පිරිවැය තොරතුරු මනාව ලබා ගැනීමට හා නියාමනය කිරීමට නොහැකි වේ.

**ඇඟවීම**

කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිවීම හේතුකොටගෙන, කළමනාකාරිත්වයට කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ මෙහෙයුම් කාලීනව නියාමනය හා පාලනය කළ නොහැකිවී ඇත. හස්ත ගණනය කිරීම්/අවිධිමත් මාර්ග වලින් ජනනය වූ තොරතුරු පදනම් කරගෙන මෙහෙයුම් නියාමනය හා තීරණ ගැනීම හේතුකොටගෙන ඵලදායක නොවන අකාර්යක්ෂම තීරණ ගැනීම හා ව්‍යාපාර පාලනයකට තුඩු දේ.

**නිර්දේශය**

කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ කාර්යසාධනය සම්බන්ධයෙන් නියාමනය හා ක්‍රමෝපාය තීරණ ගැනීම සඳහා නිරවද්‍ය හා කාලීන තොරතුරු උත්පාදනය කෙරෙන කළමනාකාරිත්ව තොරතුරු පද්ධතියක් හඳුන්වා දිය යුතුය.

**<u>රා. දැ. සංස්ථා ප්‍රතිචාරය</u>**

සම්පත් උපයෝජනය නිෂ්පාදනය හා මූල්‍ය ප්‍රගතිය නියාමනය කිරීම සඳහා රා. දැ. සංස්ථාව තොරතුරු පද්ධතියක් හඳුන්වා දී ඇත. සම්පත් උපයෝජනය, නිෂ්පාදනය හා මාර්ග ගත ඇණවුම් සම්පූර්ණ කිරීම නියාමනය සඳහා රා.දැ.සංස්ථාව ඊආර්පී පරිගණක පද්ධතිය පරීක්ෂා කරමින් සිටී.

## 3.10 උපයෝජනය කරන ලද තථ්‍ය සම්පත්, ප්‍රමිත සම්පත් සමඟ සැසඳීම.

**නිරීක්ෂණ**

කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිවීම හේතුකොටගෙන නිෂ්පාදන ක්‍රියාවලියට උපයෝජනය කළ තථ්‍ය සම්පත් සෘජුව හඳුනා ගැනීමට නොහැකි වුවද 2010 මැයි, ජූනි හා ජූලි මාස වලදී නිෂ්පාදන ක්‍රියාවලියට උපයෝජනය කළ තථ්‍ය දැව, ශ්‍රමය සහ භාවිතා කළ යන්ත්‍ර පැය අපි ගණනය කර කල්දෙමුල්ල කර්මාන්තශාලාව උපයෝජනය කළ ප්‍රමිත සම්පත් සමඟ සැසඳු වෙමු.

**දැව**

උපයෝජනය කළ සත්‍ය දැව ප්‍රමාණය අවශ්‍ය ප්‍රමිත දැව ප්‍රමාණයට සමාන බවත් දැව පදම් කිරීමේ යන්ත්‍රාගාරයෙන් කර්මාන්තශාලාවට ලැබුණු දැව ප්‍රමාණය සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ බවත් අපි උපකල්පනය කළෙමු.

| මාසය | මැයි | ජූනි | ජූලි |
|---|---|---|---|
| | **ඝන ඩෙ.මී** | **ඝන ඩෙ.මී** | **ඝන ඩෙ.මී** |
| සංරචක නිෂ්පාදනය (A) | 1,871 | 5,483 | 2,444 |
| නිමි ද්‍රව්‍ය නිෂ්පාදනය (B) | 9,531 | 16,232 | 35,538 |
| නිෂ්පාදන එකතුව (C = A + B) | 11,402 | 21,715 | 37,983 |
| නිෂ්පාදන එකතුව + සියයට10ක අපතය D =C 1.1) | 12,542 | 23,887 | 41,781 |
| කර්මාන්තශාලාවට නිකුත් කළ පදම් කළ දැව (E) | 15,157 | 30,188 | 61,094 |
| **පදම් කළ දැව අපතය (F = E - D)** | **2,615** | **6,301** | **19,313** |
| පදම් කළ දැව අපතය E හි ප්‍රතිශතයක් ලෙස | 21 | 26 | 46 |

ලීබඩු කර්මාන්තශාලාවේ සාමාන්‍ය අපතය, මුළු නිෂ්පාදනයෙන් සියයට10 ක් ලෙස අප සලකන ලදී.

2010 මැයි, ජූනි හා ජූලි මාසවල පදම් කළ දැව අපතය පිළිවෙලින් සියයට21, සියයට 26 හා සියයට 46 ක් බව නිරීක්ෂණය කළෙමු. නිෂ්පාදන ක්‍රියාවලියක මෙය ඉතා ඉහළ අගයක් බව අපි සලකමු.

**ඉහත අපතයට හේතු**

- සැපයුම් ලැයිස්තු සකස් කිරීමේදී කර්මාන්තශාලාව,දැව පදම් කිරීමේ යන්ත්‍රාගාරය සහ ඉරුම් මෝල අතර සම්බන්ධීකරණයක් නොමැති වීම.
- අවශ්‍යතාව ඉක්මවා දැව පදම් කිරීමේ යන්ත්‍රාගාරයෙන් කර්මාන්තශාලාවට දැව තොග වශයෙන් නිකුත් කිරීම.

- දැව පදම් කිරීමේ යන්ත්‍රාගාරයෙන් කර්මාන්තශාලාවට ලැබුණු සම්පූර්ණ දැව ප්‍රමාණයම, ඒවා සම්පූර්ණයෙන උපයෝජනය වුවාද නැද්ද නොසලකා නිෂ්පාදන ක්‍රියාවලියට සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ බවට සලකා තිබුණි. මාසයකදී එසේ භාවිතා නොකළ දැව ප්‍රමාණයෙහි පිරිවැය, එම මාසයේ මුළු නිෂ්පාදන පිරිවැයට ඇතුළත් විය. කෙසේවෙතත්, උපයෝජනය නොකරන ලද අතිරික්ත දැව ප්‍රමාණය කර්මාන්තශාලාව තුළ හෝ පිටත ගබඩා කර තිබුණි. පසුව කී තොග බාහිර පරිසරයට විවෘතව පැවතුණි.
- කර්මාන්තශාලාවේ විධිමත් අට්ටිගැසීම් පද්ධතියක් නොමැති වීම.
- අපගේ පරීක්ෂණයේදී භෞතිකව නිරීක්ෂණය කළ පරිදි ප්‍රමාණවත් නොවන කර්මාන්තශාලාවේ නියාමනය හා අධීක්ෂණය හේතුකොටගෙන පහත සඳහන් අසතුටුදායක ලක්ෂණයන් දක්නට ලැබුණි.

- අපහරණය කිරීමට සළකුණු කොට තිබූ දැව තොග අතර භාවිතා කළහැකි දැව තිබීම.
- අඩක් නිමි සංරචක , අවිධිමත් ලෙස සවිකළ කොටස් භාවිතා නොකොට කර්මාන්තශාලාවේ තබා තිබුණි.

**ඇඟවීම**

- අවිධිමත් නිෂ්පාදන සැලැස්ම නිසා පාරිභෝජනය නිවැරදි නොවීය. පරිභෝජනයෙන් ඉතිරි වූ කොටස් ඉන්වෙන්ට්‍රියට ගත යුතුය.
- ඵලදායී තොරතුරු පද්ධතියක් නොමැතිවීමෙන්, කාලීන හා යාවත්කාලීන තීරණ වලට බාධා පමුණුවයි. (ගන්නා ලද තීරණ නිවැරදි නොවන, අනුචිත හා යල්පැන ගිය ඒවායි.)
- යටිතල පහසුකම් නොමැතිවීමෙන් අධික අපතය ප්‍රමාණයන් වාර්තා වන අතර, දුර්වල ගබඩාකරණය හේතුකොටගෙන දැව වල ගුණාත්මක තත්ත්වය පිරිහෙන අවස්ථා
- නියාමනයක් නොමැතිවීමෙන් මෙහෙයවීම නැති වන අතර කර්මාන්තශාලාවේ මෙහෙවර හා අරමුණුවලින් බැහැර වේ.

**නිර්දේශ**

- ප්‍රධාන කළමනාකරුවන්, සැලසුම් ක්‍රියාවලියට සම්බන්ධ වියයුතු විධිමත් නිෂ්පාදන සැලැස්මක් කර්මාන්තශාලාවට තිබිය යුතුය. (ප්‍රදර්ශනාගාරයේ ප්‍රධානී, ඉරුම් මෝල ප්‍රධානි, දැව පදම් කිරීමේ යන්ත්‍රාගාර ප්‍රධානී සහ කම්හල් ප්‍රධානී)
- තොරතුරු ලබා ගැනීමට රා.දැ.සංස්ථාව කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දිය යුතුය.
- ක්‍රියාකාරකම් විධිමත්ව නියාමනය කිරීම.
- යටිතල පහසුකම්, වැඩිදියුණු කිරීමට හා අපතයන් අවම කිරීමට එස්-5 ක්‍රමය හඳුන්වා දීම.

**ශ්‍රමය**

**නිරීක්ෂණ**

තොරතුරු /ක.තො.ප. නොමැතිවීම හේතුවෙන් අපගේ නිරීක්ෂණ කැපුම් හා යන්ත්‍ර අංශවල ශ්‍රමයට සීමා විය.

සමහර තේරාගත් විෂයයන් සම්බන්ධයෙන් පහත සඳහන් සමීකරණය භාවිතා කරමින් අපි තථ්‍ය ශ්‍රමය ගණනය කළෙමු.

තොරාගත් විෂයක තත්‍ය ශ්‍රම පැය = { අදාළ මාසය සඳහා මුළු තථ්‍ය ශ්‍රම පැය ගණන / මාසය තුළ උපයෝජනය කළ මුළු තථ්‍ය දැව ප්‍රමාණය (කියුබික් ඩෙසි මීටර්) } X { නිශ්චිත විෂයයකට ආරෝපණය කළහැකි දැව කියුබික් ඩෙසි මීටර් ප්‍රමාණය }

| | ලීබඩු විෂයය | ඒකකයකට තත්‍ය ශ්‍රමය පැය ගණන (කැපුම්, යන්ත්‍ර සහ සවිකිරීම් අංශ) | | |
|---|---|---|---|---|
| | | 2010 මැයි | 2010 ජූනි | 2010 ජූලි |
| 1. | දේශනශාලා පුටුව | 7.88 | 5.33 | 3.14 |
| 2. | හාන්සි පුටුව | 6.89 | 4.67 | 2.75 |
| 3. | ලිපිකරු මේසය | 30.15 | 20.41 | 12.03 |
| 4. | කණිෂ්ඨ විධායක මේසය | 45.92 | 31.09 | 18.32 |
| 5. | තනි ඇඳ | 44.79 | 30.33 | 17.87 |
| 6. | සාමාන්‍ය පුටුව | 5.58 | 3.78 | 2.23 |
| 7. | ද්විත්ව ඇඳ | 71.4 | 48.34 | 28.48 |
| 8. | සාමාන්‍ය මේසය | 37.94 | 25.69 | 15.14 |
| 9. | සම්මන්ත්‍රණ පුටුව | 4.56 | 3.08 | 1.82 |
| 10. | කෑම මේස පුටුව | 6.43 | 4.35 | 2.57 |

2010 මැයි සහ ජූලි සමඟ සසඳන විට තෝරාගත් විෂයයන්වලට උපයෝජනය කළ තත්‍ය පැය ගණන් 2010 ජූලි මාසයේදී සැළකිය යුතු ලෙස අඩුවී තිබුණි. එහෙත් තොරතුරු නොමැතිවීම හේතුකොටගෙන ඒකකයට ශ්‍රම පැය ගණන මෙපමණ ප්‍රමාණයකින් අඩුවීමට හේතු හඳුනා ගැනීමට අපට නොහැකි විය.

ඒකකයට අවශ්‍ය ප්‍රමිත ශ්‍රම පැය ගණන පිළිබඳ තොරතුරු නොමැතිවීම හේතුවෙන්, ඒකකයට තථ්‍ය ශ්‍රම පැය ඒකකයට ප්‍රමිත ශ්‍රම පැය ගණන සමග සැසඳීමට අපට නොහැකි විය.

**ශ්‍රම උපයෝජනය**

කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ කැපුම් හා යන්ත්‍ර අංශවල 2010 මැයි සිට 2010 ජූලි දක්වා පැවැති තත්‍ය ශ්‍රම පැය ගණන් පහත දැක්වේ.

| **අංශය** | **මැයි** | **ජූනි** | **ජූලි** |
|---|---|---|---|
| කැපුම් | 1,311 | 1,551 | 1,603 |
| යන්ත්‍ර | 1,727 | 2,043 | 2,369 |
| පැවැති ශ්‍රම පැය ගණන | 3,038 | 3,594 | 3,972 |
| නිශ්කාර්ය ශ්‍රමය (කැපුම් හා යන්ත්‍ර පමණක්) | 1,331 | 1,897 | 2,432 |
| නිශ්කාර්ය ශ්‍රමය ප්‍රතිශතයක් ලෙස | 44% | 53% | 61% |

2010 ජූනි මාසය හා සසඳන විට 2010 ජූලි මාසයේදී තථ්‍ය ශ්‍රම පැය ගණන සියයට20 කින් වැඩි වුණු අතර, 2010 මැයි මාසය හා සසඳන විට 2010 ජූනි මාසයේ තථ්‍ය ශ්‍රමය සියයට 15 කින් වැඩි විය. 2010 ජූනි මාසය හා සසඳන විට 2010 ජූලි මාසයේදී මුළු නිෂ්පාදනය සියයට 64කින් වැඩිවූ අතර, මැයි මාසය හා සසඳන විට ජූනි මාසයේ මුළු නිෂ්පාදන සියයට 90 කින් වැඩි විය. විධිමත් නිෂ්පාදන සැලැස්මක් නොමැතිවීම මෙම නිශ්කාර්ය ශ්‍රම පැය ගණන් වලට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**ඇගයීම්**

- නිශ්කාර්ය ශ්‍රමය, ලීබඩු අයිතමවල අතිරේක පිරිවැයට හේතු විය.
- පවත්නා ශ්‍රමය, කම්හලේ ශ්‍රම අවශ්‍යතාවය හා සැසඳීමේදී අවශ්‍ය ප්‍රමාණයටත් වඩා පවතී.
- අභිප්‍රේරණ මට්ටම අඩු කෙරෙනු ඇත.
- අනෙකුත් ශ්‍රමයට, නිෂ්කාර්ය ශ්‍රමය අහිතකරව බලපායි.
- ඒකකයක අතිරේක පිරිවැය වැඩිවීම.
- නිෂ්කාර්ය ශ්‍රමය, ශ්‍රම නොසන්සුන්තාවට හා වෘත්තීය සංගම් ක්‍රියාකාරකම් වලට හේතු විය හැක.

**නිර්දේශ**

- නිෂ්පාදනය කරන එක් එක් අයිතමය සඳහා කාර්ය පත්‍රිකා සහිත විධිමත් නිෂ්පාදන සැලසුම් පද්ධතියක් තිබීම.
- ශ්‍රමිකයන්ගේ කාර්යසාධනය මත බෝනස්/දිරි ගැන්වීමේ දීමනා ක්‍රමයක් හඳුන්වාදීම.
- සේවකයින්ගේ කාර්යසාධනය මාසිකව නියාමනය කළ යුතුය.ප්‍රතිපෝෂණය විධිමත්ව කළ යුතුය. ප්‍රමිතියට අනුකූලව කාර්ය ඉටු නොකරන සේවකයන් සම්බන්ධ නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.
- පවත්නා ශ්‍රමය උපරිම ආකාරයෙන් උපයෝජනය කෙරෙන පරිදි නිෂ්පාදන ක්‍රියාවලිය සැලසුම් කළ යුතුය.

- අවශ්‍ය කුසලතා හඳුනාගත යුතුය. ඒ අනුව අවශ්‍ය පුහුණුව හඳුන්වා දිය යුතුය.

**යන්ත්‍ර**

**නිරීක්ෂණ**

තෝරාගත් විෂයයන් කීපයක් සම්බන්ධයෙන් තථ්‍ය යන්ත්‍ර පැය පහත සඳහන් සමීකරණය භාවිතා කරමින් අපි ගණනය කළෙමු.

තෝරාගත් විෂයක් සඳහා තථ්‍ය යන්ත්‍ර පැය = ( අදාළ මාසය සඳහා මුළු තථ්‍ය යන්ත්‍ර පැය ගණන / මාසයේදී උපයෝජනය කරන ලද තථ්‍ය මුළු දැව ඒකක ගණන (කියුබික් ඩෙසි මීටර්) ) X නිශ්චිත විෂයයකට ආරෝපණය දී ඇති කරන ලද දැව කියුබික් ඩෙසි මීටර් ගණන

| | ලීබඩු විෂයය | ඒකකයකට තථ්‍ය යන්ත්‍ර පැය (කැපුම් හා යන්ත්‍ර අංශ) 2010 මැයි | 2010 ජූනි | 2010 ජූලි |
|---|---|---|---|---|
| 1. | දේශනශාලා පුටුව | 2.09 | 1.01 | 0.49 |
| 2. | හාන්සි පුටුව | 1.83 | 0.88 | 0.43 |
| 3. | ලිපිකරු මේසය | 7.99 | 3.85 | 1.89 |
| 4. | කණිෂ්ඨ විධායක මේසය | 12.16 | 5.87 | 2.88 |
| 5. | තනි ඇඳ | 11.86 | 5.72 | 2.81 |
| 6. | සාමාන්‍ය පුටුව | 1.48 | 0.71 | 0.35 |
| 7. | ද්විත්ව ඇඳ | 18.91 | 9.12 | 4.48 |
| 8. | සාමාන්‍ය මේසය | 10.05 | 4.85 | 2.38 |
| 9. | කුෂන් කළ සම්මන්ත්‍රණශාලා පුටුව | 1.48 | 0.71 | 0.35 |
| 10. | කෑම මේස පුටුව | 1.7 | 0.82 | 0.4 |

තෝරාගත් විෂයයන්වල ඒකකයට තත්‍ය යන්ත්‍ර පැය, 2010 මැයි මස සිට 2010 ජූලි දක්වා සැලකිය යුතු ලෙස අඩුවී තිබුණි. කෙසේවෙතත්, තොරතුරු නොමැතිවීම හේතුවෙන් අපට ඒකකයට යන්ත්‍ර පැය විශාල ලෙස අඩුවීමට හේතු හඳුනා ගත නොහැකි විය. අවශ්‍ය ප්‍රමිත යන්ත්‍ර පැය පිළිබඳ තොරතුරු නොමැතිවීම හේතුවෙන්, ඒකකයට ප්‍රමිත යන්ත්‍ර පැය ගණන්, තථ්‍ය ඒකකයකට යන්ත්‍ර පැය ගණන් සමඟ සැසඳිය නොහැකි විය.

**යන්ත්‍ර උපයෝජනය**

| මාසය | පවත්නා උපරිම යන්ත්‍ර පැය ගණන (A) | උපයෝජනය කළ තථ්‍ය යන්ත්‍ර පැය ගණන (B) | නිශ්ක්‍රීය යන්ත්‍ර පැය ගණන (A-B) |
|---|---|---|---|
| මැයි | 3,480 | 1,185 | 2,295 |
| ජූනි | 4,060 | 1,089 | 2,971 |
| ජූලි | 4,263 | 875 | 3,388 |

2010 ජූලි මාසයේදී තථ්‍ය යන්ත්‍ර පැය 2010 ජූනි මාසයට සාපේක්ෂව සියයට 20 කින අඩු වූ අතර 2010 ජූනි මාසයේ තථ්‍ය යන්ත්‍ර පැය 2010 මැයි මාසයට සාපේක්ෂව සියයට 8 කින් අඩු විය. 2010 ජූලි මාසයේ මුළු නිෂ්පාදනය 2010 ජූනි මාසයට සාපේක්ෂව සියයට 64 කින් වැඩි වූ අතර, 2010 ජූනි මස මුළු නිෂ්පාදනය 2010 මැයි මාසයට සාපේක්ෂව සියයට 90 කින් වැඩි විය.

2010 මුල් අර්ධ වර්ෂය තුළදී, යන්ත්‍ර වලන් යන්ත්‍ර 06 ක උපයෝජනය යන්ත්‍රයකට පැය 15 ට වඩා අඩු විය.

යන්ත්‍ර වැඩි ප්‍රමාණයක් හොඳ මෙහෙයුම් තත්ත්වයේ තිබූ නමුත් යන්ත්‍ර රාශයක් ඒවායේ උපරිම ධාරිතාවෙන් උපයෝජනය කර නොතිබුණි.

**නිශ්ක්‍රීය යන්ත්‍ර පැය වලට හේතු**

* නිෂ්පාදන සැලැස්මක් නොමැතිවීම.
* ප්‍රවීන යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැතිවීම.

**ඇඟවීම**

* නිෂ්ක්‍රීය යන්ත්‍ර පැය, නිෂ්පාදන පිරිවැය වැඩිවීමට, කාර්යක්ෂමතාවට හානිවීම් වලට, සම්පත් උපයෝජනය අඩුවීමට හේතු කාරක වියහැක.
* නිෂ්ක්‍රීය වීම නිසා යන්ත්‍ර හානිවිය හැක. (කිසිදු ප්‍රතිලාභයක් ජනනය නොකර යන්ත්‍ර ක්ෂයවීම.

**නිර්දේශය.**

ඵලදායකව හා කාර්යක්ෂමව යන්ත්‍ර ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම සඳහා විධිමත් නිෂ්පාදන සැලසුම් පද්ධතියක් හඳුන්වා දිය යුතුය.

රා.දැ. සංස්ථා ප්‍රතිචාරය

*	ඕනෑම දෙපාර්තමේන්තුවක/ සංවිධානයක හෝ සංස්ථා වැඩ අංගනයක ද්‍රව්‍ය අපතය, නිෂ්කාර්ය ශ්‍රමය සහ නිෂ්කාර්ය යන්ත්‍ර පැය නියතයකි. කෙසේවෙතත්, කළමනාකාරීත්වය විසින් ක්‍රියාත්මක කර ඇති විවිධ පියවරයන් නිසා රා. දැ. සංස්ථාවේ මෙය අවම කර ඇත.

*	සම්පත් උපයෝජනය, නිෂ්පාදනය හා මූල්‍ය ප්‍රගතිය නියාමනය කිරීම සඳහා රා. දැ. සංස්ථා කළමනාකාරීත්වය තොරතුරු පද්ධතියක් හඳුන්වාදී ඇත. රා. දැ. සංස්ථාව දැනට ඊආර්පී පරිගණක පද්ධතිය පරීක්ෂා කරමින් පවතින අතර, එමගින් සම්පත් උපයෝජනය, නිෂ්පාදනය හා මාර්ගගත ඇනවුම් සම්පූර්ණ කිරීම නියාමනය කළහැකි වේ.

*	නිෂ්පාදන අංශ වලට හඳුන්වාදී ඇති පිරිවැය ක්‍රමය මගින් සම්පත් උපයෝජනය, එනම් ශ්‍රමය, ද්‍රව්‍ය යන්ත්‍ර, විචලනය සමඟම සෘජු පිරිවැය හඳුනාගත හැකිය. එය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිරිවැය හා සම්පත් උපයෝජනය ඵලදායකව නියාමනය කිරීමට කළමනාකාරීත්වයට සහාය වන අතර, එයින් ඵලදායිත්වය හා ලාභදායිත්වය වැඩි දියුණු කෙරේ.

*	දැව අපතය පිළිබඳව වාර්තාවෙන් පෙන්වාදී ඇති දුර්වලතාවයන් පරීක්ෂා කිරීමට හා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට හා නිර්දේශ කළ පරිදි එස් - 5 ක්‍රමය හඳුන්වා දීමට රා. දැ. සංස්ථාව පියවර ගනු ලබයි.

*	කෙසේවෙතත්, යන්ත්‍ර ඒවායෙහි උපරිම ධාරිතාවෙන් ක්‍රියා නොකිරීම හේතුවෙන් යන්ත්‍ර පැය නිශ්ක්‍රීය වන බවට වූ ඔබගේ තර්කය හා අපට එකඟ විය නොහැක. පවත්නා සම්පත් පදනම් කරගෙන අවශ්‍ය පරිදි හා අවස්ථාවල යන්ත්‍ර ක්‍රියාත්මක කරනු ලබයි.

- සම්පූර්ණ සංකීර්ණයේ පිහිටීම හා භෞතික යටිතල පහසුකම් සම්බන්ධයෙන් ගත්කළ රාජ්‍ය දැව සංස්ථාව ඵලදායිත්වය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීමට සහාය වන "නියමිත වේලාවට ක්‍රමය" යටතේ කල්දෙමුල්ල සංකීර්ණයේ පහසුකම් ප්‍රතිශ්ඨාපනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත.

III කොටස

## 3.11 ප්‍රසම්පාදන පර්පාටි මාර්ගෝපදේශ වලට අනුකූලවීම පිළිබඳ තක්සේරු කිරීම.

**නිරීක්ෂණ**

කල්දෙමුල්ල කර්මාන්තශාලාව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට හා ප්‍රසම්පාදන අත්පොතේ විධිවිධාන වලට අනුකූල විය යුතුය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන පහත සඳහන් අඩුපාඩු අපි නිරීක්ෂණය කළෙමු.

* ඔප දැමීමේ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අත්පොතේ නිශ්චය කර ඇති පරිදි මිල ගණන් කැඳවා නොතිබුණි. සහකාර සාමාන්‍යාධිකාරී විසින් (කල්දෙමුල්ල) 2008 ජූලි මස 21 දින මිල ගණන් 03 ක් පදනම් කරගෙන දෙන ලද අනුමැතියක් මත, කල්දෙමුල්ල කර්මාන්තශාලාව 2010 මාර්තු දක්වා නැවත නැවතත් අඛණ්ඩව ඔප දැමීමේ ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

* කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ පින්තාරුකරුවන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා වලදී අනාවරණය වූයේ සපයා ඇති ද්‍රව්‍ය සම්මත ගුණාත්මක තත්ත්වයට අනුකූල නොවූ බවය.

  2010 මාර්තු මැද භාගයෙන් පසු කල්දෙමුල්ල කර්මාන්තශාලාව වෙනුවෙන් ඔප දැමීමේ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය ප්‍රධාන කාර්යාලය භාර ගන්නා ලදී.

* දෘඩාංග විෂයයන් සම්බන්ධයෙන්, කල්දෙමුල්ල පරිශ්‍රය ආසන්නයේ ව්‍යාපාර කටයුතු කළ සැපයුම්කරුවන්ගෙන් විවෘත මිල ගණන් 5 ක් ලබාගෙන තිබුණි. අවස්ථා රැසකදී කර්මාන්තශාලාවේ සේවකයෙකු විසින් සැපයුම්කරුවන් ගෙන් අවිධිමත් ලෙස මිල ගණන් ලබාගෙන තිබුණි. විගණන දිනය දක්වා මෙම පර්පාටිය අඛණ්ඩව අනුගමනය කරමින් පැවතුණි.

* රු.25,000 අනුමත සීමාව ඉක්මවීම වැළැක්වීම සඳහා මුළු වටිනාකම කොටස් වලට බෙදා මිලදී ගැනීම් කර ඇති අවස්ථා අප නිරීක්ෂණය කළෙමු.

* 2010 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලය හරහා කරන ලද මිලදී ගැනීම් සම්බන්ධයෙන් ගත් කළ, අවම මිල ගණන නොවන මිල සැදහුමක් තෝරා ගැනීම නිසා ශ්‍රී.ල.රු.324,000 ක වැඩිපුර ගෙවීමක් කර ඇති බව නිරීක්ෂණය විය.

  2010 වර්ෂය සඳහා වූ මිලදී ගැනීම් කිරීමට පෙර එම නියැදි පරීක්ෂා කර නොතිබුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**ඇගයීම**

- නිශ්චිත ප්‍රසම්පාදන පර්පාටි වලට අනුකූල නොවීම, කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ ගනුදෙනු අනාර්ථික වීමට හේතු කාරක විය හැක.
- නිමි නිපයුම් වල සම්මත ගුණාත්මක බව පවත්වා ගැනීමට අපොහොසත් වීම.
- උසස ගුණාත්මක නිෂ්පාදන අඩු මිලට ගතහැකි අවස්ථාවල දී සැපයුම්කරුවන්ට අතිරික්ත ගෙවීම් කිරීම.
- සම්මතයන්ට අනුකූල නොවූ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරමෙන් ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වයට බලපෑම් ඇති විය හැකිය.

**නිර්දේශ**

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට හා ප්‍රසම්පාදන අත්පොතට කළමනාකාරීත්වය විසින් තරයේ අනුකූලවීම.
- මිලදීගත් ද්‍රව්‍ය වල ගුණාත්මක භාවය පරීක්ෂා කිරීමේ වැඩපිළිවෙලක් තිබීම.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට තරයේ අනුකූල වන ලෙස හා අනුගමනය කරන ලෙස රා. දැ. සංස්ථා කළමනාකාරීත්වය උපදෙස් දී ඇත. 3.11 වගන්තියෙන් වාර්තා කරන ලද නිරීක්ෂණ කළමනාකාරීත්වය විසින් සටහන් කර ගන්නා අතර, ඒ පිළිබඳ පසු විපරම් කටයුතු කරනු ඇත.

## 3.12 බඳවාගැනීමේ ප්‍රතිපත්තියක් නොමැතිවීම.

**නිරීක්ෂණ**

රාජ්‍ය දැව සංස්ථාවට අනුමත බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැති බව අපි සටහන් කළෙමු. එවැනි බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් නොතිබීම හේතුවෙන් කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ ශ්‍රම අවශ්‍යතා නොසළකා අතිරික්ත නුපුහුණු ශ්‍රමිකයන් සේවයේ යොදවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අපි තවදුරටත් පහත සඳහන් කරුණු සටහන් කළෙමු.

- වඩු කාර්මිකයන් ලෙස කුලියට ගත් ඇතැම් සේවකයන් සහකාර යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ දැව තෝරන්නන් වැනි වෙනත් කාර්යයන්හි යොදවා තිබුණි.
- වඩු කාර්මිකයන් 16 දෙනෙකු සේවයේ යොදවා තිබූ නමුත්, 4 දෙනෙකු පමණක් වඩු කර්මාන්තයෙහි යෙදී සිටියහ.

- කම්හල් කළමනාකරුවෙකු පත්කර නොතිබූ අතර, කම්හල් කළමනාකරුගේ රාජකාරි කර්මාන්තශාලාවක් කළමනාකරණය කිරීමේ කුසලතා නොමැති පිරිවැය නිලධාරියෙකුට පවරා තිබුණි.
- කර්මාන්තශාලාව සඳහා තත්ත්ව ආරක්ෂණ නිලධාරියෙකු පත්කර නොතිබුණි. එබැවින් කල්දෙමුල්ල කර්මාන්තශාලාව තත්ත්ව පාලන ක්‍රියාවලියක් භාවිතා නොකරන ලදී.
- ශ්‍රමිකයන් බොහෝ දෙනෙකුට ප්‍රමාණවත් පුහුණුවක් ලබාදී නොතිබුණි. ශ්‍රමිකයන් දහඅට දෙනෙකු මාස තුනක් ද, ශ්‍රමිකයින් හතර දෙනෙකු දින තුනක් ද පුහුණු කර තිබුණි. ඇතැම් සේවකයන්ට විධිමත් පුහුණුවක් ලබානොදී වැඩ පවරාදී තිබූ බව අපි වැඩිදුරටත් නිරීක්ෂණය කළෙමු.

**ඇඟවීම**

- තත්කාර්ය බඳවාගැනීමේ පරිචය හේතුවෙන් (ප්‍රතිපත්තියක් නොමැති නිසා) කළමනාකාරීත්වය විසින් නුපුහුණු සේවකයින් බඳවාගෙන තිබුණි. පුහුණුව, සංවර්ධනය, ව්‍යුහය සහ පුහුණු අවශ්‍යතා විශ්ලේෂණ ක්‍රියාවලියක් නොමැතිවීම, කර්මාන්තශාලාවේ අකාර්යක්ෂමතාවටද තුඩු දී ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ සියලුම අංශවල අකාර්යක්ෂමතාවයයි. (ඵලදායිතාව අඩුවීම හා ගුණාත්මක නොවන භාණ්ඩ නිෂ්පාදනය)
- තත්ත්ව ආරක්ෂණ නිලධාරියෙකු නොමැතිවීම හා තත්ත්ව පාලන ක්‍රියාවලියක් නොමැතිවීම තත්ත්වයෙන් බාල ලීබඩු නිපදවීමට හේතු කාරක විය.

2010 අගෝස්තු 12 දින පොලිස් මූලස්ථානයට අලෙවි කරන ලද කෑම මේස පුටු 50 ක් තත්ත්වයෙන් බාල භාණ්ඩවීම හේතුවෙන් 2010 අගෝස්තු 13 දින ආපසු එවීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

**නිර්දේශ**

- බඳවාගැනීමේ ප්‍රතිපත්තියක් , අනුමත කාර්ය මණ්ඩලයක් සහ බඳවා ගැනීමේ පරිපාටියක් හඳුන්වාදීම කෙරෙහි වහා අවධානය යොමු කළ යුතුය.
- කම්හල් කාර්ය මණ්ඩලය අඛණ්ඩ පදනමක් මත, සමාලෝචනය කළ යුතු අතර අනුමත කාර්ය මණ්ඩලයට අනුරූපව බඳවා ගැනීම් කළ යුතුය.
- අඛණ්ඩ පදනමක් මත පුහුණු අවශ්‍යතා තක්සේරු කළ යුතු අතර අවශ්‍ය අවස්ථාවල දී මත සියලුම සේවකයන්ට කාර්යයේ නියුතු හා පන්ති කාමර පුහුණුව සැපයිය යුතුය.
- ලීබඩු නිෂ්පාදන ක්ෂේත්‍රයේ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ අත්දැකීම් සහිත සුදුසුකම් ලත් තත්ත්ව ආරක්ෂණ නිලධාරියෙකු පත්කොට තත්ත්ව ආරක්ෂණ කාර්යය තහවුරු කළ යුතුය.

රා. දැ. සංස්ථා ප්‍රතිචාරය

## 3.13 ඉඩම් හා ගොඩනැගිලි අයිතිය හා උපයෝජනය.

**නිරීක්ෂණය**

1969 නොවැම්බර් 07 දිනැති අංක.14879 දරන ගැසට් නිවේදනය මගින් කල්දෙමුල්ල ඉඩමේ හා ගොඩනැගිල්ලේ අයිතිය රාජ්‍ය දැව සංස්ථාවට පවරාදී ඇත. කෙසේවෙතත්, කල්දෙමුල්ල ඉඩම හා ගොඩනැගිල්ල ඓතහාසික පිරිවැය මත පෙන්වන අතර රා. දැ. සංස්ථා ගිණුම් පොත්වල ඒවා ප්‍රත්‍යාගණන අගයට හෝ වෙළෙඳපොල වටිනාකමට පෙන්වා නොතිබුණි.

ඉඩමේ මුළු වපසරිය හෙක්ටයාර් 3.26 ක් වුවත්, එහි වැඩි කොටසක් ඵලදායක ලෙස උපයෝජනය කර නොතිබුණි. ප්‍රමාණවත් ඉඩකඩ තිබුණ ද ආවරණයක් නොමැතිව දැව පදම් කිරීමේ යන්ත්‍රාගාරයෙන් පිටත ගබඩා කර ඇති පදම්කල දැව ගබඩා කිරීමට අට්ටි ගැසීමේ ගබඩාවක් ඉදකිරීමට කළමනාකාරිත්වය කිසිදු පියවරක් ගෙන නොතිබුණි. (පදම් කල දැව ස්වභාවික පරිසරයට නිරාවරණව පැවති අතර එබැවින් දැවවල තත්ත්වය බාල වෙමින් පැවතුණි)

පදම් කළ දැව ස්වභාවික පරිසරයට නිරාවරණ වන ආකාරයෙන් අට්ටි ගසා ඇති අයුරු පහත සඳහන් ජායා රූපවලින් පෙනේ.




නිමි ලීබඩු උපකරණ ඒවා ගබඩා කිරීමට නුසුදුසු ප්‍රදේශවල ගබඩා කර තිබූ බව අපි වැඩිදුරටත් නිරීක්ෂණය කළෙමු. (නිමි නිෂ්පාදන ගබඩා කර තිබූ ස්ථානවල දූවිලි හා අපද්‍රව්‍ය සුලභ දර්ශනයක් විය) කර්මාන්තශාලාවේ සේවකයන් සමඟ සාකච්ඡා කිරීමේදී අනාවරණය වූයේ නිමි ද්‍රව්‍ය අලෙවි කරන බොහෝ අවස්ථා වලදී එම භාණ්ඩ යළි ඔපදැමීම කළයුතු බවයි.

**ඇගැයීම**

- කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ ඉඩම හා ගොඩනැගිල්ලේ වටිනාකම රාජ්‍ය දැව සංස්ථා ගිණුම් පොත්වල අඩුවෙන් දැක්වේ.

- පදම් කළ දැව සහ නිමි නිෂ්පාදන ගබඩා කිරීමට යෝග්‍ය නොවන භූමි ප්‍රදේශයක ගබඩා කිරීමෙන් තත්ත්වය පහළ යාමක් හා මූල්‍ය පාඩු සිදුවේ. (කල්දෙමුල්ල කර්මාන්තශාලාවට අවාසි වන පරිදි වූ මිල ගණන් වලට වෙන්දේසි කර ඇත.)

- ඉඩම් හා ගොඩනැගිලි ඵලදායී නොවන ආකාරයෙන් භාවිතය නිසා ඉඩම ලාභදායී ව්‍යාපාරයක උපයෝජනය කිරීමේ අවස්ථාව කල්දෙමුල්ල කර්මාන්තශාලාවට අහිමි වී ඇත. (නිෂ්පාදන යන්ත්‍රය පුළුල් කිරීම, පදම් කළ දැව බාහිර ගණුදෙනුකරුවන්ට විකිණීම වැනි නව ව්‍යාපාර)

**නිර්දේශ**

- ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කොට ප්‍රත්‍යාගණනය කිරීමට වහාම කටයුතු කර ප්‍රවර්තන වෙළෙඳපොල වටිනාකම ගිණුම් පොත්වල නිරූපනය කිරීමට කටයුතු කළ යුතුය.

- අවශ්‍ය ගබඩා පහසුකම් තක්සේරු කොට අතිරේක ගබඩා පහසුකම් ඉදිකිරීමට කටයුතු කිරීම.

- පවත්නා ඉඩම් හා ගොඩනැගිලි විකල්ප භාවිතය සඳහා තක්සේරු කොට කල්දෙමුල්ල කර්මාන්තශාලාවට විකල්ප ආදායම් මාර්ග ලබාගැනීමට කටයුතු කිරීම.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

"නියමිත වේලාවට ක්‍රමය" යටතේ භූමියේ සංකීර්ණ පහසුකම් පතිස්ථාපනය කිරීම සහ නව ප්‍රදර්ශනාගාරයක් ඉදිකිරීමෙන් ඵලදායී නොවන ඉඩම් හා ගොඩනැගිලි භාවිතය මගින් මෙය නිවැරදි කරනු ලැබේ.

## 3.14 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ වලට අනුකූල නොවීම.

**නිරීක්ෂණ**

| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| 3.2 වගන්තිය<br>අධ්‍යකෂ මණ්ඩලයේ සංයුතිය | සභාපති, ක්‍රියාකාර අධ්‍යක්ෂ, වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් ,මහා භාණ්ඩාගාර නියෝජිතයෙකු හා වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සැදුනු සාමාජිකයන් 7 දෙනකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. |
| 3.6(අ) වගන්තිය<br>අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සකස් කල ආකාරයෙන්ම සහ ආයතනයේ පුළුල් වශයෙන් මහජනතාවගේ ඇලිම් සඳහා ක්‍රියාත්මක කරන බවට සහතික විය යුතුය.<br><br>(ආ) වගන්තිය<br>කළමනාකරණ තොරතුරු වාර්තා මගින් කළමනාකරණ කටයුතු නියාමනය කළ යුතු අතර ව්‍යවසාය එහි මෙහෙයුම් කටයුතු නිසි මග ගමන් කරන බවට තහවුරු කර ගැනීමට කාර්ය සාධනය ඇගයිය යුතුය.<br><br>(ඇ)වගන්තිය<br>ප්‍රතිඵල අපේක්ෂිත ඉලක්ක වලට නොගැලපේ නම් ඒවා සාක්ෂාත් කරගැනීමට අප්‍රමාදව පිළියම් යෙදිය යුතුය | කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ අනුගමනය කරන පටිපාටි පිළිබඳව මාර්ගෝපදේශවල සඳහන් අවශ්‍යතා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන බවට සාක්ෂි සහ සතුටුදායක ලෙස මාර්ගෝපදේශවලට අනුකූලව තථ්‍ය පටිපාටි ක්‍රියාත්මක කරනවාද යන්න තහවුරු කිරීමට සාක්ෂි නොවීය. |
| 4.2.2. වගන්තිය<br>අධ්‍යක්ෂ මණ්ඩලය එහි සංයුක්ත සැලස්ම,අයවැය ලේඛනය සහ කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කර තථ්‍ය කාර්ය සාධනය සැලසුම් කල ආකාරයෙන් ක්‍රියාත්මක වේදැයි තහවුරු කරගත යුතුය.පළුල් විෂමතා නිරීක්ෂණය වුවහොත් අවශ්‍ය වූ විට සැලසුම් / අයවැය සංශෝධනය කොට කාලීනව ක්ෂණික ක්‍රියාමාර්ග ගතයුතුය. | 2009 සහ 2010 වර්ෂවලදී මාසික රැස්වීම් ක්‍රමවත් පදනමින් පවත්වා නොතිබුණි.එබැවින් අක්‍රමිකතා වැලැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය කාලීන ක්ෂණික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br><br>ඊට අමතරව කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව වාර්ෂික අය වැය ලේඛන පිළියෙල නොකරන බවත් එහි කාර්ය සාධනය අයවැය සමග තක්සේරු නොකරන බවද අපි නිරීක්ෂණය කළෙමු. |
| පෝෂණ කළමනාකරුවන් ඔවුන්ට පැවරු කාර්යන්වල වගකීම් ඉටුකරනවාද යන්න හා විනිවිද භාවය සාක්ෂාත්කරනවාද යන්න තහවුරු කර ගැනීමට වරින් වර නියාමනය අවශ්‍යයෙන්ම කළ යුතුය. | ඉකුත් වර්ෂවලට අදාලව විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වල සංස්ථාව මගින් පවත්වාගෙන යන සියලුම ප්‍රදර්ශනාගාරවල සමස්ථ ඍණ තතත්වයක් හෙළදරව් කර තිබුණි.කෙසේ වෙතත් අපගේ ඉල්ලීම මත කම්හල් කළමනාකරණය විසින් කල්දෙමුල්ල සංකීර්ණයේ වූ මූල්‍ය කාර්ය සාධනය වෙනම පෙන්වීමට පහත සඳහන් වූ මූල්‍ය තොරතුරු පිළියෙල කරන ලදී. |

| වර්ෂය | පාඩුව මි.ශ්‍රි.ල | විකුණුම් මි .ශ්‍රි.ල. | නිෂ්පාදන රු.මි. | පරිපාලන ශ්‍රි.ල.රු.මි. |
|---|---|---|---|---|
| 2007 | 21 | 22.8 | 23.8 | 20.00 |
| 2oo8 | 11 | 22.9 | 8.6 | 25.30 |
| 2009 | 29 | 21.7 | 25.3 | 25.4 |

ඉකුත් වර්ෂ සමග සැසදමේ දී ප්‍රමාණවත් නොවන විකුණුම් පරිමාව නිෂ්පාදන පිරිවැය වැඩිවීම සහ පරිපාලන පිරිවැය වැඩි වීම හේතු කොට ගෙන ගෘහ භාණ්ඩ නිෂ්පාදන යන්ත්‍රාගාරයේ ගණනය කළ හැකි පාඩු සිදු වී තිබුණි.

5.1.2 වගන්තිය

සැලසුම් කාල පරිච්ජේදය තුලදී සාක්ෂාත් කරගත යුතු අභිමතාර්ථ සහ ඉලක්ක සමග කළමනාකරුවන්ගේ වගකීම් ක්‍රියාකාර සැලැස්මෙන් පැහැදිලිව හදුනාගත යුතුය.

සංයක්ත සැලසුමක් භාවිතයේ පැවතුනත් පහත සදහන් පරිදි සැලැස්මේ සදහන් ප්‍රධාන යෝජනා, කළමනාකරණය විසින් ක්‍රියාත්මක කර නොතිබු බව නිරීක්ෂණය විය.

- නිෂ්පාදනය සහ ලී බඩු හා අනෙකුත් දැව ආශිත නිෂ්පාදන වල තරගකාරීත්වය වැඩි කිරීම.
  - ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීමට කම්හල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට හා පුළුල් කිරීමට විදුලි බලය ලබාගැනීම හා ප්‍රසම්පාදනය, යන්ත්‍ර ස්ථාපනය කිරීම, පුහුණු හා නුපුහුණු සේවකයින් පුහුණු කිරීම සදහා කමිටුවක් පත්කිරීම, කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවට තත්ව පාලන නිලධාරියෙකු, සහකාර තත්ව පාලන නිලධාරින් 2ක සහ නිෂ්පාදන කළමනාකරුවෙකු බදවා ගැනීම.
- ලී බඩු ප්‍රදර්ශනාගාර වල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.
  - මොරටුවේ ප්‍රදර්ශනාගාර ඉදිකිරීමට යොජනා කෙරුණි.
  - ශක්‍යතා අධ්‍යයනයක් කිරීම.
- ඉදිරි වර්ෂ 5 තුලදී ලී බඩු උපකරණ සංගමය සහ පුද්ගලික නිෂ්පාදකයින් 10ක් සමග ක්‍රමෝපාය හවුල් ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම.

දැව නිෂ්පාදන හා විකුණුම් සම්බන්ධ අරමුණු පමණක් සදහන් කරමින් 2008,2009 සහ 2010 වර්ෂ සදහා වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කර තිබු නමුත් අනෙකුත් අරමුණු එනම්, සංයුක්ත සැලැස්මේ සදහන් කර ඇති ලී බඩු නිෂපාදනය හා අලෙවිය පිළිබද අවධානය යොමුකර නොතිබුණි.

**ඇගයීම**

- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛ සහ අනෙකුත් යහපාලන මාර්ගෝපදේශ අවශ්‍යතා වලට අනුකූල නොවීම.
- සංයුක්.ත සැලැස්ම අනුගමනය නොකිරීම හේතුවෙන් කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව එහි අභිමතාර්ථ සහ අරමුණු සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වීම.
- 2008 - 2012 කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ ඉලක්ක නියමකර නොතිබීම සහ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් නොමැතිවීම හේතුකොටගෙන තථ්‍ය කාර්ය සාධනය ඇගයීමට නොහැකි විය.

**නිර්දේශය**

2003 ජුනි 2 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ නිශ්චය කර ඇති සංයුක්ත යහපාලන මාර්ගෝපදේශ පිළිපැදීමට අධ්‍යක්ෂ මණ්ඩලය කඩිනම් පියවර ගත යුතුය.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

## <u>IV කොටස</u>

### 3.15 පාරිසරික බලපෑම.

**නිරීක්ෂණ**

- 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැස්ට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ (ඇ) කොටසේ 18 වගන්තිය අනුව දිනකට කියුබික් මීටර් 50ට නො අඩු මෝල් ධාරිතාවයක් ඇති ලී මෝලක් මෙහෙය වීමට බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත් අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නියම කරන ලද එම බලපත්‍රය රාජ්‍ය දැව සංස්ථාව විසින් කල්දෙමුල්ල ලී මෝලට ලබාගෙන නොමැති බව නිරීක්ෂණය කළෙමු.
- 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ IV අ -(පාරිසරික ආරක්ෂාව) කොටසේ 23 අ වගන්තිය අනුව සහ 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධිත) පනත ප්‍රකාරව අපද්‍රව්‍යය පරිසරයට මුදා හැරීම, විමෝචනය හෝ තැන්පත් කිරීම සපුරා තහනම් වේ. තවද 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ අ කොටසේ 64 වගන්තිය ප්‍රකාරව බොරොන් ප්‍රතිකර්මය හැර රසායන ප්‍රතිකර්මය හා දැව ආරක්ෂණය හා සම්බන්ධ කර්මාන්ත සඳහා බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වේ.
- 2010 සැප්තැම්බර් 03 දාතමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද ලිපිය අනුව 2010 සැප්තැම්බර් 13 දින කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ කළමනාකරු බස්නාහිර පළාතේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවත්නා බල පත්‍රය අළුත් කරන ලෙස අයදුම් පතක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් විගණන ක්ෂේත්‍ර කටයුතු පවත්වන ලද 2010 සැප්තැම්බර් 30 වන තුරුත් බලපත්‍රය අළුත්කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොතිබුණි.බලපත්‍රය අළුත්කිරීම සඳහා වූ අයදුම් පත්‍රය එහි කාලය ඉකුත් වීමට මාස තුනකට පෙර මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එකී අවශ්‍යතාව කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව අනුගමනය කර නොතිබුණි.

- 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 ද දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයේ අ' කොටසේ රෙගුලාසිවල 64 වගන්තිය ප්‍රකාරව 2010 අගෝස්තු 18 දින සිට 2011 අගෝස්තු 17 දින දක්වා ලබාගත් බලපත්‍රයේ පහත සදහන් අතරේක වගන්ති හා කොන්දේසි නිශ්චය කර තිබුණි.

  - උතුරායාම, කිල්තාර / උදුන් තෙල්වලින් දුෂ්‍ය වීම නැවැත්වීම සදහා දැව ප්‍රතිකර්ම භුමියෙන් වැසි ජල කානු වෙන්කල යුතුය.කෙසේ වෙතත් කිල්තාර/ උදුන් තෙල් නොසැලකිලිමත් ලෙස පරිශ්‍රය තුල ගබඩා කර තිබු බව නිරීක්ෂණය කළෙමු. පහත සදහන් ඡායාරූපයෙන් පෙන්නුම් කෙරෙන පරිදි කයෝසෝට් තෙල් බැරල් වාතාශ්‍රයට විවෘත කර ගබඩා කර තිබුණි.



මේවා අන්තරායකර රසායනික ද්‍රව්‍ය නිසා කියෝතාර බැරල් ගබඩා කරන විට අනතුරු සිදුවීම වැලැක්වීමට සහ අපතේ යාමෙන් සිදුවන දුෂනය වැලැක්වීමට විධිමත් ආරක්ෂාවන් යෙදිය යුතුය.

- බිම මතු පිට හෝ භුගත ජලය දූෂනය වීම වැලැක්වීම සදහා අපතේයැම් සහ හදිසියේ සිදුවන මුදාහැරීම් රැස්කිරීම් පහසුකම් සහිතව දැව ප්‍රතිකර්ම භුමි ප්‍රදේශය හා ප්‍රතිකර්ම කරන ලද දැව ඇසිරීම් සදහාවන ගබඩා ඉතා හොදින් සිමෙන්ති දමා සකස් කළ යුතුය.

- කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොමැති බව නිරීක්ෂනය විය.එබැවින් ප්‍රතිකර්ම ප්‍රදේශ වලින් අපතේ යන හා මුදාහරින කියෝතාර වලින් අවට ඉඩම් දුෂනය වී තිබුණි.පහත සදහන් ඡායාරූප වලින් දැක්වෙන පරිදි කියෝතාර පසට හා භුගත ජලයට ඍජුවම උරාගන්නා බවට සහ වැසි ජල කානුව උතුරා යන බවට සාක්ෂි සපයයි



- 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 'ආ'වගන්තිය ප්‍රකාර 2010 අගෝස්ත 30 දින ලබාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අනුව පහත සදහන් අතිරේක වගන්ති හා කොන්දේසි පිළිපැදිය යුතුය.

  - භුමියෙන් බැහැර කරන තුරු ලී කුඩු තාවකාලික කුටියක ගබඩා කළ යුතුය.

  - කර්මාන්ත ශාලාවේ වැඩ කරන සේවකයනගෙ සෞඛ්‍ය සම්බන්ධයෙන් කර්මාන්ත ශාලා ආඥා පනතේ හා එහි සංශෝධන වළ ඇතුළත් රීති හා රෙගුලාසි පිළිපැදීමට අවශ්‍ය වේ.

-1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රායෝගික හැම අවස්ථාවකමදීම එක් එක් වැඩකරන කාමරයකට ප්‍රමාණාත්මකව වාතාශය සමග පිරිසිදු සුළං පැතිරෙන පරිදි ඵලදායි හා යෝග්‍ය පහසුකම් සැලසිය යුතුය.

- ලී මෝල හා කර්මාන්ත ශාලාව මෙහෙයවීම සඳහා දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- ජාතික පරිසර පනතේ නියමයන් පරිදි විධිමත් තත්ත්වයක් යටතේ අපහරණය නොකර ලී කුඩු විවෘත භූමියට අපහරණය කර තිබූ බව නිරීක්ෂණය විය.

- කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ වැඩකරන සේවකයින් දූලි මුකවාඩම් සහ ආරක්ෂිත හිස් වැසුම් වැනි ආරක්ෂිත අම්පන්න පැලඳීමක් නොමැතිව වැඩවල නිරත වන බවද නිරීක්ෂණය විය. සේවකයින් ආරක්ෂිත ආම්පන්න පලඳින්නේ නැතිව යන්ත්‍රයක් ක්‍රියාකරවන අවස්ථාවකට උදාහරණයක් පහත චිත්‍රයෙන් පෙන්නුම් කෙරේ.




**ඇඟවීම**

හානිකර රසායන ද්‍රව්‍ය හා ලි කුඩු ගබඩා කිරීමේදී, අපහරණයේදී හා පරිහරණයේදී (කියෝතාර/ උදුන් තෙල් ) පාරිසරික රෙගුලාසි වලට හා කර්මාන්තයේ උසස් පරිචයන්ට අනුකූල වීමට අපොහොසත් වීම සහ කර්මාන්ත ශාලා ආඥා පනතේ නියමයන්ට අනුකූලව කර්මාන්තශාලා කටයුතු පවත්වාගෙන නොයැම හේතු කොටගෙන කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව හා රාජ්‍ය දැව සංස්ථාව නෛතික ගැටළු වලට මුහුණ දීමට සිදුවිය හැකිය.

**නිර්දේශ**

- බිම මතුපිට හෝ භූගත ජලය දූෂ්‍ය වීම වැලැක්වීම සඳහා අපතේයාම් වලින් හා හදිසියේ සිදුවන මුදාහැරීම් රැස්කිරීමේ පහසුකම් සහිතව දැව ප්‍රතිකර්ම භූමි ප්‍රදේශය ප්‍රතිකර්ම කළ දැව ගබඩා කරන භූමි ප්‍රදේශයන් හා කියෝතාර බැරල් ගබඩා කරන භූමි ප්‍රදේශය ඉතා හොඳින් සිමෙන්ති දමා සකස් කළ යුතුය.තවද එම බැරල් ආරක්ෂිත ප්‍රදේශයක ගබඩා කළ යුතුය.
- අප ද්‍රව්‍ය (ලී කුඩු ) රෙගුලාසි වලට අනුකූලව අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- කර්මාන්ත ශාලාව ඇතුලතට ප්‍රමාණාත්මකව වාතාශ්‍රය හා ආලෝකය සැපයීමට හා කම්කරුවන්ට ආරක්ෂක ආම්පන්න සැපයීමට කටයුතු කිරීම.
- කර්මාන්ත ශාලාව හා ලී මෝල පවත්වාගෙන යාම සඳහා දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ අනුමැතිය ලබා ගැනීම.

- භාවිතා කල නොහැකි යන්ත්‍ර සංරචක හා අර්ධ එකලස් සහ යල්පැන ගිය ලී බඩු කර්මාන්ත ශාලා පරිශ්‍රයෙන් ඉවත් කළ යුතුය.එස් - 5 සංකල්පය හඳුන්වා දිය යුතුය.
- දුවිල්ල පරිසරයට විමෝචනය වීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම හෝ ලී කුඩු නොසැලකිලිමත් ලෙස පරිසරයට අපහරණය කිරීමකින් තොරව විකිණීම.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

## V කොටස

**පොදු නිරීක්ෂණ**

3.16 කර්මාන්තශාලාව, ලී මෝල සහ පදම්කිරීමේ යනත්‍රාගාරයෙ විවිධ අංශ අතර සම්බන්ධීකරණය හා සැලසුම්කිරීම නොමැති වීම.

**නිරීක්ෂණ**

ලී මෝල, කර්මාන්තශාලාව හා පදම්කරීමේ යන්ත්‍රාගාරය අතර සම්බන්ධිකරණය හා සන්නිවේදනය සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණයන් කරන ලදී.

- කර්මාන්ත ශාලාවන්හි නිෂ්පාදන සහ පිරිවිතර අවශ්‍යතා පදනම් කරගෙන ලී මෝලෙන් දැව ඉල්ලුම් කරයි. එසේ කරමින් කර්මාන්ත ශාලාව පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ ඉරූ පදම්කළ දැව තිබේද නැද්ද යන්න ගැන පරීක්ෂා නොකරයි. මේ හේතුවෙන් නිතරම පදම්කිරීමේ යන්ත්‍රාගාරයේ ඒ හා සමාන පදම් කළ දැව ප්‍රමාණවත් ව තිබියදීත් අතිරේක දැව ඉරා පදම්කිරීමේ යන්ත්‍රාගාරයට නිකුත් කරයි. මේ තත්ත්වය, ඵලදායි නොවන හා අකාර්යක්ෂම මෙහෙයුම් සිදු වීමට හා ද්‍රව්‍ය අපතේ යෑම් වලට හේතු කාරක වේ.
- කර්මාන්ත ශාලාව පැහැදිලිව එහි දැව අවශ්‍යතා ලී මෝලට සංනිවේදනය නොකරයි එහි ප්‍රතිඵලයක් ලෙස ලී මෝල, කර්මාන්ත ශාලාවේ අවශ්‍යතාවට අනුකූල නොවන දැව සපයයි.අවසානයේදී එකී දැව අපතේ යාම සිදුවේ.
- කර්මාන්ත ශාලාවේ පිරිවිතරයන් සඳහා දැව කැපීම හා ඉරීමට අමතරව, නිෂ්පාදන ඉලක්ක වලට මුහුණ දීමට ලී මෝල, පදම් කිරීමේ යන්ත්‍රාගාරයට අතිරේක දැව නිකුත් කරයි.
  බොහෝ විට මෙම අතිරේක දැව නිෂපාදන ක්‍රියාවලියට උපයෝජනය නොකර වෙන්දේසියේ අඩු මිලට විකිණීම හෝ අපතතේ යාම අවසන් වෙයි.

**<u>ඇඟවීම්</u>**

විවිධ අංශ අතර සම්බන්ධිකරණය හා සංනිවේදනය නොමැති වීම හේතුවෙන් කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව පාඩු ගෙන දෙමින් මෙහෙයුම් අකාරයක්ෂමවීමට හා ඵලදායි නොවීමට හේතු කාරක වේ.

ජනප්‍රිය නොවන ප්‍රමාණයන් සහ ස්වභාවික පරිසරයට නිරාවරණය වීම් නිසා අගය අඩුවීම හේතු කොටගෙන ලී බඩු උපකරණ නිෂ්පාදනය කිරීමට භාවිතා කළ නොහැකි වීම මත 2007 සිට 2010 දක්වා ඉරූ දැව වෙන්දේසියේ විකිණීම උදාහරණයක් ලෙස දිය හැකිය.2007 සිට 2010 සැප්තැම්බර් 15 දක්වා කාලය තුලදී පොත් අගය ශ්‍රී ල රු.1,215,891 ක් වූ දැව ලොට් 18ක් (තේක්ක, බුරුත ,කොස් ,මහෝගනී ,ග්‍රාන්ඩිස් ,මයික්‍රෝ,

පයිනස් වැනි ) ශ්‍රී ල රු.193,900 කට වෙන්දේසි කර ඇති බව අනාවරණය විය. මෙයින් සිදුවූ පාඩුව ශ්‍රී ලං රු.1,021,991ක් විය.

**නිර්දේශ**

- විධිමත් නිෂ්පාදන සැලසුම් ක්‍රියාවලියක් හඳුන්වා දිය යුතු වන අතර අංශ අතර සම්බන්ධීකරණය හා සන්නිවේදනය පුළුල් කළ යුතුය.
- පදම්කිරීමේ යන්ත්‍රාගාරයට නිකුත් කිරීමට අවශ්‍ය වන ඉරු දැව ප්‍රමාණයන් හා වර්ග පිළිබඳ පැහැදිලි උපදෙස් ලී මෝලට නිකුත් කළ යුතුය.
- ලී මෝල සමග ඇණවුමක් කිරීමට පෙර, පදම්කිරීමේ යන්ත්‍රාගාරයේ පවත්නා තොග කර්මාන්තශාලාව විසින් පරීක්ෂා කළ යුතුය.

**රා. දැ. සංස්ථා ප්‍රතිචාරය**

**3.17 ඉරීම සඳහා කඳන් හඳුනාගැනීමට විධිමත් පටිපාටියක් නොමැති වීම.**

**නිරීක්ෂණය**

ඉරීම සැලසුම් කිරීමේදී ඉරුම් මෝලේ සේවකයින් සුදුසු දැව කඳන් හඳුනා නොගන්නා බව අපි නිරීක්ෂණය කළෙමු. සමාන්‍යයෙන් කර්මාන්තශාලාව එහි භාවිතය සඳහා අඩි 3ක පරිධිය සහිත කඳන් ඉල්ලුම් කරයි. එහෙත් විශාල වට ප්‍රමාණයකින් යුතු කඳන් ලී මෝල විසින්.ඉරනු ලබන අවස්ථා නිරීක්ෂණය කළෙමු. මේ හේතුවෙන් දැව නිෂ්පාදනය කර්මාන්ත ශාලාවට භාවිතා කිරීමට නොගැලපෙන තත්වයක පැවතුණි. එකී දැව, ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි.

**ඇඟවීම**

පරිධිය අඩි 3 කට වඩා වැඩි දැව කඳන් අලෙවි සැල් මගින් ඉතා වැඩි මිලකට විකිණිය හැකිය. එවැනි කඳන් කර්මාන්ත ශාලාවේ කාර්යයන්ට නිකුත් කිරීම සම්පත් නාස්තියක් ලෙස සැලකිය හැකිය.

**නිර්දේශ**

අපතේයෑම වලක්වා ගැනීම සඳහා කර්මාන්ත ශාලාවේ දැව අවශ්‍යතාවයට උචිත වන පරිදි කැපීමට හා ඉරීමට විධිමත්ව සැලසුම් කළ යුතුය.

රා. දැ.සංස්ථා ප්‍රතිචාරය

## 3.18 රාජ්‍ය දැව සංස්ථාව විසින් අතාත්තිකව නිෂ්පාදනයන් ඉලක්ත ගත කිරීම.

**නිරීක්ෂණ**

- රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවි කළමනාකරණ, නිෂ්පාදන කළමනාකරු හා කළමනාකරණ ගණකාධිකාරි ආදින්ගේ සමන්විත විශේෂ කණ්ඩායමක් විසින් ලී මෝල සහ ලී බඩු කම්හලේ නිෂ්පාදන ඉලක්ක නිශ්චය කරනු ලැබේ.

- එකී ඉලක්ක සපුරාගැනීම සදහා ලී බඩු කර්මාන්ත ශාලාවේ එවැනි දැව ඉල්ලීමක් නොමැතිව වුවත් ඉරුම් මෝල ජනප්‍රිය සහ ජනප්‍රිය නොවන යන ප්‍රමාණයන් දෙකටම දැව ඉරමින් සිටි බව නිරීක්ෂණය කළෙමු. ජනප්‍රිය නොවන ප්‍රමාණයන් සදහා වු දැව ,කර්මාන්ත ශාලාව ඉතා කලාතුරකින් භාවිතා කිරම හේතුවෙන් පදම් කිරිමේ යන්ත්‍රාගාරයේ එකතු වේ. අනතුරුව කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවට පාඩු සිදුවෙමින් අඩු මිලට වෙන්දේසියේ විකුණයි. 2010 මැයි, ජුනි සහ සැප්තැම්බර් යන මාසවලදී පිරිවැය රු.1,241,396 ක් වු විවිධ වර්ගයේ දැව ලොට් 22ක් (තේක්ක, බුරුත,මහෝගනී,මයික්‍රෝ, කොස්, ග්‍රාන්ඩිස්, කුඹුක්, පයිනස් වැනි)රු 145,800කට වෙන්දේසියෙ විකිණිමෙන් රු1,095,596ක පාඩුවක් සිදුවීම උදාහරණයක් වශයෙන් දැක්විය හැකය. රු 1,083,676ක් වටිනා හොඳ තතවයේ දැව ලොට් 17ක් වෙන්දේසියට ඉදිරිපත් කළ නමුත් ඉතා අඩු ලංසු ලැබීම හේතු කොට ගෙන නොවිකුණා ඇති බවද නිරීක්ෂණය කළෙමු.

- එසේම ඉල්ලුමක් නොමැතිව සහ ඇණවුම් වලින් තහවුරු කරගෙන නොමැතිව හුදෙක් ඉලක්ක සපුරා ගැනීමට පමණක් කර්මාන්ත ශාලාව ලී බඩු නිෂ්පාදනය කරයි. සම්පුර්ණයෙන් හෝ අඩක් සවිකල සහ නිමි නිෂ්පාදන එවැනි විශාල ප්‍රමාණයක් ගබඩාවේ පිළවෙලක් නොමැතිව තබා තිබුණි. මෙවැනි පරිචයන් නිසා හානි සහ අපතයන් සිදු වේ. එවැනි අසතුටුදායක තත්වයන් පහත සදහන් චිත්‍ර වලින් පෙන්නුම් කෙරේ.





**ඇගයීම**

දැව කැපීමේදී හා ලී බඩු නිෂ්පාදනය කිරීමේදී ඵලදායි නොවන සැලසුම්කරණය, සම්පත් නාස්තියට හා අවසානයේ කල්දෙමුල්ල කර්මාන්තශාලාවට මූල්‍ය පාඩු සිදු වීමට හේතු කාරක වේ.

**නිර්දේශය**

ඉරුම් මෝලට හා කර්මාන්ත ශාලාවට ඉල්ලුමට සරිලන විධිමත් නිෂ්පාදන සැලැස්මක් සහ තාත්වික ඉලක්ක හඳුන්වා දිය යුතුය.

**රා.දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

## 3.19 පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ විධිමත් ගබඩා වාර්තා පවත්වාගෙන නොයයි.

**නිරීක්ෂණ**

- දැව ලැබීම් සහ නිකුත් කිරීම් විධිමත් කිරීම සඳහා පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ යාවත්කාලීන/විධිමත් තොග වාර්තා පවත්වාගනු නොලබන බව නිරීක්ෂණය කළෙමු.

- තවද, ගබඩාවේ විධිමත් අට්ටි ගැසීමේ පද්ධතියක් නොමැත. පදම් කරන ලද දැව සඳහා විධිමත් ගබඩාකරණ පහසුකම් නොමැති අතර දැව හානියට පත්කිරීමට ඉඩ හරිමින් පදම් කරමේ යන්ත්‍රාගාරයට බාහිරින් ස්වභාවික හානිවලට අනාවරණය කරමින් ගබඩාකර තිබුණි.

**ඇගයීම**

- දැව පදම් කිරීමේ යන්ත්‍රාගාර විසින් අනුගමනය කරන දුර්වල ගබඩා වාර්තා පවත්වාගෙන යාම හේතුවෙන් පදම් කිරීමේ යන්ත්‍රාගාර ගබඩා වල පවතින දැව වල වර්ගය හා ප්‍රමාණයන් හඳුනාගැනීම අපහසු වේ.
- ප්‍රමාණවත් නොවන හා අවිධිමත් ගබඩාකරණය නිසා පදම් කළ දැව හානියට පත්වන අතර ඒවා අතිරේක පිරිවැය දරමින් යලි පදම් කිරීමට අවශ්‍ය විය හැකිය.

**නිර්දේශය**

පදම් කරන ලද දැව විධිමත් ආකාරයෙන් ගබඩා කිරීම සඳහා කළමනාකරණය විසින් නව දැව ගබඩා ඉදිකිරීම් අවශ්‍ය වේ. පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ අංග සම්පූර්ණ හා යාවත්කාලීන කළ ගබඩා ලෙජරයක් පවත්වාගෙ ගැනීම සඳහා විධිමත් ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

## 3.20 2009 දෙසැම්බර් 31 දිනට පදම්කිරීමේ යන්ත්‍රාගාරයේ තොග සත්‍යාපනය පැවැත්වීම.

**නිරීක්ෂණය**

2009 දෙසැම්බර් 31 දිනට පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ තොග භෞතිකව සත්‍යාපනය කර නොතිබූ බව අපි සටහන් කළෙමු. ඒ වෙනුවට පොත් ශේෂ, භෞතික ශේෂ ලෙස ගිණුම්ගත කර තිබුණි.

ඒ යටතේ 2010 අගෝස්තු 12 දින සිට 2010 ඔක්තෝබර් 06 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී සම්පූර්ණ තොගයම රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන්ද සමග භෞතිකව සත්‍යාපනය කරන ලෙස අප කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ කළමනාකාරීත්වයෙන් ඉල්ලා සිටියෙමු. භෞතික සත්‍යාපනය අවසානයේදී පදම්කිරීමේ යන්ත්‍රාගාරයේ තොගය ශ්‍රී.ලං. රු.5,522,777කට අගය කරන ලදී. එම ඇගයීම රු.6,851,477 ක් වූ පොත් ශේෂයන්හි අගය සමග සැසඳීමේදී එදිනට තොගයේ තථ්‍ය අගය පොත් ශේෂයන්ට වඩා රු1,328,700 කින් අඩු වී තිබූ බව අනාවරණය විය.

**ඇඟවීම**

විධිමත් කාල පරතරයන්හි දී සහ එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී භෞතිකව තොග සත්‍යාපනය කිරීමට අපොහොසත් වීමෙන් පොත් ගැලපීම සහ අක්‍රමිකතා විමර්ශනය කිරීම පහත සඳහන් ප්‍රතිවිපාක ඇති කරයි .

(අ) අනාවරණය කරගැනීමෙන් හා සොයා ගැනීමෙන් තොරව අක්‍රමිකතා තහවුරු කිරීම.

(ආ) තොග වටිනාකම සහ ලාභය/පාඩුව මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් / වැඩියෙන් දැක්වීම.

**නිර්දේශය**

හැකි අවස්ථාවලදී විගණකවරුන් ඉදිරිපිට විධිමත් කාල පරතරයන්හි දී හා එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී එක් එක් ස්ථාන වල තොග භෞතිකව සත්‍යාපනය කළ යුතුය. ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා එහිදි අනාවරණය වන විෂමතා විමර්ශනය කිරීමට පියවර ගත යුතුය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

## 3.21 ඉරූ දැව ඉවත් කළ කොටස් බොයිලේරුවට පාවිච්චි කිරීම.

**නිරීක්ෂණ**

ලී බඩු වල විවිධ කොටස් නිෂ්පාදනය කළ හැකි ඉරූ දැව ඉවත් කළ කොටස්, පදම්කිරීමේ යන්ත්‍රාගාරයේ තාප දර බොයිලේරුවේ දර වශයෙන් යොදා ගන්නා බව නිරීක්ෂණය කළෙමු.
පහත සඳහන් චිත්‍රයෙන් එවැනි ඉවත් කළ දැව කැලි බොයිලේරුව අසල අට්ටි ගසා ඇති බව පෙන්නුම් කරයි.



**ඇඟවීම**

වෙනත් ආකාරයකින් ලී බඩු නිෂ්පාදනයට භාවිතා කළ හැකි ගුණාත්මක දැව කොටස් දර වශයෙන් භාවිතා කිරීමෙන් සම්පත් අරපිරිමැසුම් රහිතව භාවිතා කිරීමට හා අවසානයේ එය කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ පාඩුවට එකතු වීමට හේතු කාරක වෙයි.

**නිර්දේශය**

දැව ඉවත් කල කොටස් බොයිලේරුවට දර වශයෙන් පාවිච්චි කිරීමට පෙර එම කොටස් වෙන් කර ගැනීම සඳහා විධිමත් පද්ධතියක් හඳුන්වා දිය යුතුය.

**රා.දැ.සංස්ථාවේ ප්‍රතිචාරය**

## 3.22 කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ පාවිච්චි නොකල දැව කඳන්

**නිරීක්ෂණය**

සමහර අවස්ථා වලදී කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ කළමනාකාරිත්වය පිට පළාත්වල ඩිපෝවලට ගොස් දැව කඳන් සහ ඉරූ දැව කල්දෙමුල්ල සංකීර්ණයට එවන ලෙස එකී ඩිපෝ වල නිලධාරීන් ගෙන් ඉල්ලුම් කර තිබුණු බව අපි සටහන් කලෙමු. අවිචාරවත් ලෙස ඇනවුම් කිරීම හේතු කොට ගෙන එකී දැව කඳන් කල්දෙමුල්ල සංකීර්ණයේ භාවිතයෙන් තොරව ගබඩා කර තිබුණි.

**ඇඟවීම**

ලී බඩු නිෂ්පාදනය කිරීමට දැව කඳන් හා ඉරූ දැව භාවිතා නොකිරීම හෝ අලෙවි සැල් වලට මාරු නොකිරීම හේතු කොට ගෙන ඒවා දිරාපත් වීමට හෝ හානියට පත්වීමට හේතු කාරක විය හැකිය.

**නිර්දේශය**

නිශ්චිත සැලැස්මකට අනුව ඇණවුම් කිරීම සහ දැව නිෂ්කාර්යව තබා ගැනීමට වඩා ලීබඩු නිෂ්පාදනයට භාවිතා කිරීම කළ යුතුය. කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය වර්ගවල දැව සඳහා පමණක් ඇණවුම සීමා කළ යුතුය.

**රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රතිචාරය**

VI කොටස

<u>3.</u>23 ප්‍රදර්ශනාගාර යෙන් ඇණවුම් නොමැතිව පවා ලී බඩු කර්මාන්තශාලාවලින් නිමි ද්‍රව්‍ය මාරු කිරීම.

**නිරීක්ෂණ**

- විධිමත් විකුණුම් සැලැස්මක් නොමැතිව විවිධ තැන්වල ස්ථානගත කර ඇති ලී බඩු කර්මාන්ත ශාලා ලී බඩු නිෂ්පාදනය කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම නිෂ්පාදනවලට ඉල්ලුමක් නැතත් කර්මාන්තශාලා වලින් ප්‍රදර්ශනාගාරයට ලී බඩු සපයයි.

- 2010 ජුලි 31 දිනට රත්මලාන ප්‍රදර්ශනාගාරයේ තොග ලැයිස්තුව සමාලෝචනයේදී පහත සඳහන් දෑ අනාවරණය විය.

  - 2010 ජුලි 31 දිනට තිබු තොග වටිනාකමෙන් සියයට 20ක් අම්පාරෙන් ලද විෂයයන් ගෙන් සමන්විත වු අතර සමහර විෂයන් දිර්ඝ කාලයක සිට චලනය නොවී පැවතුණි.

  - 2000 වර්ෂයට පෙර ලැබුණු ලී බඩු විෂයයන් 77 ක් ප්‍රදර්ශනාගාරයේ තවමත් පවතී.

**ඇඟවීම**

විධිමත් විකුණුම් සැලැස්මක් නොමැතිව නිෂ්පාදනය කිරීම සහ අවසානයේදී නිමි නිපැයුම් ප්‍රදර්ශනාගාරවල රඳවා ගැනීමෙන් තොගයෙහි අනවශ්‍ය ලෙස ආර්ථික සම්පත් හිරවී තිබීමට හේතු කාරක වේ. මෙයින් විකුණුම් ප්‍රවර්ධනයේ අකාරයක්ෂමතාව පෙන්නුම් කෙරේ. පහත සඳහන් චිත්‍රයෙන් අතිරේක නිමි භාණ්ඩ තොග ප්‍රදර්ශනාගාරයේ ගබඩා කර ඇති ආකාරය දැක්වේ.

**නිර්දේශ**

අවබෝධයක් සහිත ගනුදෙනු කරුවන්ට ප්‍රසන්න පරිසරයක් නොවන නිසා ප්‍රදර්ශනාගාරයේ නිමි භාණ්ඩ වලින් පුරවා නොතිබිය යුතුය. ඇස් මට්ටමට ඇසට ප්‍රිය උපදවන සේ පමණක් නිමි භාණ්ඩ ප්‍රදර්ශනයට තබා තිබීම ගැන කළමනාකාරිත්වය තහවුරු කරගත යුතුය. ප්‍රමාණවත් ගබඩා ඉඩ කඩ නිමි භාණ්ඩ සඳහා තිබිය යුතුය. අලෙවි ක්‍රමෝපායක වශයෙන් ගණුදෙනුකරුවන්ට විෂයයන් තෝරා ගැනීමට එවැනි ගබඩා වලට පැමිණෙන ලෙස ආරාධනා කළ හැකිය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

## 3.24 ප්‍රදර්ශනාගාර වලට ලද ලී බඩු තොග පරීක්ෂා කිරීම.

**නිරීක්ෂණය**

කර්මාන්තශාලා වලින් ලැබෙන  භාණ්ඩ භාරගැනීම සම්බන්ධයෙන් ප්‍රදර්ශනාගාර කාර්ය මණ්ඩලය ඔවුන්ගේ අභිමතය පාවිච්චි නොකරයි. අර්ධ එකලස් හා නොනිමි භාණ්ඩ ගබඩා වල පැවති බව අපි නිරීක්ෂණය කළෙමු. සමාන්‍යයෙන් මෙවැනි භාණ්ඩ අදාළ  කර්මාන්තශාලා වලට හරවා යැවිය යුතුය.

**ඇඟවීම**

අර්ධ එකලස් හෝ නොනිමි  නිපැයුම්, ප්‍රදර්ශනාගාර කාර්ය මණ්ඩලය විසින් භාරගැනීම මගින් අනාවරණය වන්නේ දුර්වල විකුණුම් ප්‍රවර්ධනය හා අලෙවි ක්‍රමෝපායන්ය.



**නිර්දේශය**

විකුණුම් අලෙවි ක්‍රමෝපායන් හා ප්‍රදර්ශනාගාර කළමනාකරණය පිළබඳව ප්‍රදර්ශනාගාර කාර්ය මණ්ඩලයට මනා පුහුණුවක් ලබාදිය යුතුය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

### 3.25 කෙර්ගෙන යන වැඩ ඉන්වෙන්ට්‍රි හඳුනා ගැනීම

**නිරීක්ෂණ**

කෙර්ගෙන යන වැඩ ඉන්වෙන්ට්‍රි සංරචක වලින් හා අර්ධ නිමි භාණ්ඩ වලින් සමන්විත විය යුතුය. කෙසේ වෙතත්, කර්මාන්ත ශාලාවේ විධිමත් තොග වාර්තා පවත්වාගෙන නොයෑම හේතුකොට ගෙන කල්දෙමුල්ල කර්මාන්තශාලාව අර්ධ නිමි භාණ්ඩ වටිනාකම කෙර්ගෙන යන වැඩවල කොටසක් ලෙස අගය නොකරන බව නිරීක්ෂණය කළෙමු.

**ඇඟවීම**

අර්ධ නිමි සංරචක කෙර්ගෙන යන වැඩවල කොටසක් ලෙස සැලකීම හේතු කොට ගෙන, ඉන්වෙන්ට්‍රි ශේෂය අඩුවෙන් පෙන්වන අතර වර්ෂයේ පාඩුව වැඩියෙන් පෙන්වයි.

**නිර්දේශ**

- ඉන්වෙන්ට්‍රිය තබා ගැනීම සඳහා විධිමත් තොග වාර්තා තබා ගත යුතුය.
- අර්ධ නිමි භාණ්ඩ, කෙර්ගෙන යන වැඩවල කොටසක් ලෙස අගය කළ යුතුය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

### 3.26 ඉල්ලුමක් නොමැති ලී බඩු විෂයයන් සඳහා බාහිර කොන්ත්‍රාත්තරුවන් ගෙන් ඇණවුම් කිරීම.

**නිරීක්ෂණ**

කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව බාහිර කොන්ත්‍රාත්තරුවන් ගෙන් ඉල්ලුමක් නොමැති ලී බඩු විෂයයන් වෙනුවෙන් ඇණවුම් කරන බව අපි නිරීක්ෂණය කළෙමු . 2009 ජනවාරි සිට 2010 ජුලි 31 දක්වා කාලය තුළ ඉල්ලුමක් නොමැති ලී බඩු එකලස් කිරීම හා ඔප දැමීම සඳහා කොන්ත්‍රාත්තරුවන් තිදෙනෙකුට රු.1,487,173 ක ගෙවීමක් කර තිබුණි. මේ හේතුවෙන් ගබඩාවල නිමි නිපැයුම් අතිරික්තව පවතී.

පුද්ගලික කොන්ත්‍රාත්තරුවන් නිෂ්පාදනය කරනු ලබන ලී බඩු තත්ත්වයෙන් බාල බවද නිරීක්ෂණය විය. පොලිස් දෙපාර්තුමේන්තුවට විකුණන ලද දේශනශාලා පුටු 500 කින් 50 ක් ආපසු එවා තිබීම උදාහරණයක් ලෙස දැක්විය හැකිය.

**ඇඟවීම**

- කර්මාන්තශාලාවේ හා ප්‍රදර්ශනාගාර ගබඩාවල අති විශාල නිමි භාණ්ඩ තොග තුළ කාරක ප්‍රාග්ධනය හිරවී ඇත.
- කොන්ත්‍රාත්තරුවන් විසින් ඉටුකරන ලද වැඩ තුළ මනා තත්ත්ව පාලනය නොමැතිවීම හේතු කොට ගෙන විකුණුම් ආපසු එවීම සිදුවේ.
- ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් නිමි භාණ්ඩ ස්වභාවික පරිසරයට නිරාවරණය කර තිබීම හේතු කොටගෙන ඒවායේ තත්ත්වය බාල බවට පත්වේ.
- කීර්ති නාමය අහිමිවීම.

**<u>නිර්දේශ</u>**

- නොවැළැක්විය හැකි හේතු නිසා කර්මාන්ත ශාලාවෙන් ඇණවුම් කිරීමට අපහසු අවස්ථා වලදී පමණක් කල්දෙමුල්ල කර්මාන්තශාලාව බාහිර කොන්ත්‍රාත්තරුවන් ගෙන් ඇණවුම් කළ යුතුය.

- බාහිර කොන්ත්‍රාත්තරුවන් සපයන ගෘහ භාණ්ඩ සම්මත තත්ත්ව පරීක්ෂණයට යටත්ව භාර ගත යුතුය.

**රා. දැ. සංස්ථාවේ ප්‍රතිචාරය**

## <u>VII කොටස</u>

## 04. විගණන නිගමනයන්

කල්දෙමුල්ල කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව, ඵලදායව, අරපිරිමැසුම් සහිතව සහ පරිසර හිතකාමී ආකාරයෙන් ක්‍රියාත්මක කරනු නොලැබේ. පහත සාරාංශ කර ඇති සැලකිය යුතු අකාර්යක්ෂමතා සහ අනාර්ථික මෙහෙයුම් හේතුවෙන් කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව මූල්‍යමය හා වාණජමය වශයෙන් ශක්තිමත් නොවන ආකාරයෙන් වර්ෂ ගණනාවක් මෙහෙයවා ඇති බව පැහැදිලි වේ.

- ලී බඩුවල විකුණුම් මිල ගණන් වර්තමාන වෙළඳපල වටිනාකමට අඩුවෙන් ලකුණු කර තිබීම.

- ලී බඩුවල ප්‍රමිත පිරිවැය යථාරූපී නොවන අතර එය දීර්ඝ කාලයක් තිස්සේ සංශෝධනය කර නොතිබුණි.

- යන්ත්‍රාගාරය ප්‍රශස්ත විකුණුම් මිශ්‍රණයක් මත මෙහෙයවනු නොලැබේ. (සමච්ඡේද විකුණුම් මට්ටමෙන් එහා)

- ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගන්නා ආකාරයෙන් ප්‍රදර්ශනාගාරය පවත්වාගෙන නොයාම.

- අලෙවි ක්‍රමෝපායන්, ක්‍රියාකාර සැලැස්මක් හා පුහුණු කාර්ය මණ්ඩලයක් නොවීම.

- ද්‍රව්‍ය අපතය, නිශ්කාර්ය ශ්‍රමය හා යන්ත්‍ර පැය වැනි අකාර්යක්ෂමතා.

- අමුද්‍රව්‍ය අනාර්ථිකව ප්‍රසම්පාදනය සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීමට අපොහොසත් වීම.

- ඉඩම් හා ගොඩනැගිලි ඵලදායි නොවන ආකාරයෙන් භාවිතය. විශේෂයෙන් තදබල අවශ්‍යතාවයක් වන ආරක්ෂිත ගබඩා කිරීමේ ගබඩා පහසුකම් සැපයීම සඳහා නිශ්කාර්ය ඉඩම භාවිතා කර නොතිබුණි.

- නිෂ්පාදන ක්‍රියාවලිය පරිසරයට හානිකර ආකාරයෙන් කරගෙන යාම.

නිවැරදි පිළියම් යෙදීම සඳහා විගණකාධිපතිවරයාගේ නිර්දේශයන් පහත සාරාංශ කර දැක්වේ.

- ශ්‍රම බලකාය සහ යන්ත්‍රෝපකරණ ප්‍රශස්ත ධාරිතාවෙන් සහ ඵලදායකව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීම සඳහා කාර්ය මණ්ඩලය නිශ්චය කර බඳවාගැනීමේ පරිපාටියක් නිර්මාණය කර පුහුණු හා පළපුරුදු සේවකයන් පත්කර ඊට අනුමැතිය ලබාගැනීම.

- වර්තමාන වෙළඳ පොළ මිල ගණන්වලට අනුරූපව ප්‍රමිත පිරිවැය ව්‍යුහය සංශෝධනය කළයුතුය. ප්‍රවර්තන පිරිවැය ව්‍යුහය හා තරඟකාරී මිල ගණන් සැලකිල්ලට ගෙන ලී බඩුවල විකුණුම් මිල ගණන් නියම කළයුතුය.

- දැනට භාවිතයේ පවතින හස්ත පරිපාටිය වෙනුවට කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව ස්වයංක්‍රීය මිල කිරීම හා ඉන්වොයිසි කිරීමේ පරිපාටිය සහිත විකුණුම් පද්ධතියක් හඳුන්වාදීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

- පවතින සම්පත් සීමාවන් තුල කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව ව්‍යාපාරයට ධනාත්මක දායකත්වයක් ලබාදෙන වෙළඳ පොල ඉල්ලුමද සැලකිල්ලට ගෙන වඩාත් ලාභදායී විකුණුම් මිශ්‍රණයක් හඳුනාගත යුතුය.

- ප්‍රදර්ශනාගරය නවීකරණය කිරීමට සහ  සාප්පු යාමට ගනුදෙනුකරුවන කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්තවල වඩාත් ප්‍රිය කරන නිසා ප්‍රදර්ශනාගාරයේ මෙහෙයුම් පැය ගණන් ගනුදෙනුකරුවන් සිත් ඇදගන්නා අයුරින් දීර්ඝ කළයුතුය.

- කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව සහ රාජ්‍ය දැව සංස්ථාවේ අලෙවි අංශය, සර්ව සම්පූර්ණ හා උචිත අලෙවි සැලැස්මක් සංවර්ධනය කළයුතුය.  අනතුරුව එකී සංවර්ධනය කරන ලද සැලැස්මට අනුව අලෙවි කටයුතු සිදු කළයුතුය.

- ප්‍රක්ෂේපිත විකුණුම්වලට අනුකූල වන පරිද ප්‍රචාරක වියදම් අරපිරිමැසිය යුතු අතර,  ගනුදෙනු කරුවන්ට පැකේජයන් යොමු කරන විට එම පැකේජයන්වල සංයුතිය සම්බන්ධයෙන් කළමනාකරණ තරණයන් උල්ලංඝනය කිරීම් වළක්වා ගත යුතුය.

- කර්මාන්ත ශාලාවේ හා ප්‍රදර්ශනාගාරයේ සේවය කරන සියලුම කාර්ය මණ්ඩලයට විධිමත් පුහුණුවක් ලබාදිය යුතුය.  පුහුණු අවශ්‍යතා කාලීන පදනමක් මත තක්සේරු කළයුතු අතර සියලු සේවකයින්ට අවශ්‍ය වූ විට කාර්යයේ නියුතු පන්තිකාමර පුහුණුව ලබාදිය යුතුය.

- සේවකයින්ගේ කාර්ය සාධනය මාසිකව නියාමනය කොට ක්ෂණික ප්‍රතිපෝෂණය සැපයිය යුතුය. ප්‍රමිතයන්ට අනුකූලව වැඩ නොකරන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගතයුතුය. සේවකයින්ගේ කාර්ය සාධනය පදනම් කරගෙන ප්‍රසාද දීමනා/දිරිගැන්වීමේ දීමනා ගෙවීම් හඳුන්වා දිය යුතුය.

- කල්දෙමුල්ල කර්මාන්ත ශාලාවේ කාර්ය සාධනය සම්බන්ධයෙන් ක්‍රමෝපාය තීරණ ගැනීම හා නියාමනය සඳහා නිරවද්‍ය හා කාලීන තොරතුරු සම්පාදනය කිරීමට කළමනාකාරීත්ව තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වා දිය යුතුය.

- ප්‍රදර්ශනාගාරය කල්තබා එහි ඉල්ලුම තක්සේරු කිරීම අවශ්‍ය වේ. එකී ඉල්ලුම පදනම් කරගෙන කර්මාන්ත ශාලාවෙන් ඉල්ලුම් කළ යුතුය.

- ප්‍රධාන කළමනාකරුවන් (ප්‍රදර්ශනාගාර ප්‍රධානී, ලී මෝලේ ප්‍රධානි පදම් කිරීමේ යන්ත්‍රාගාර ප්‍රධානි සහ කර්මාන්ත ශාලා ප්‍රධානි) සැලසුම් ක්‍රියාවලියට හවුල්වෙන කාර්ය පත්‍රිකා (Job cards) සහිත විධිමත් නිෂ්පාදන සැලැස්මක් කර්මාන්ත ශාලාවට තිබිය යුතුය. ලී මෝලට හා කර්මාන්ත ශාලාවට විධිමත් නිෂ්පාදන සැලැසමක් හා යථාරූපී ඉලක්ක හඳුන්වා දිය යුතුය.

- දැව තොග නිෂ්කාර්යව තබාගන්නවා වෙනුවට කර්මාන්ත ශාලාවේ දැව අවශ්‍යතා විධිමත්ව සැලසුම් කර කාර්යක්ෂම හා ඵලදායී නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා දැව කැපීම හා ඉරීම එකී සැලැස්මට අනුව කළයුතුය. තවද බොයිලේරුවට දර වෙනුවට පාවිච්චිකිරීමට පෙර දැව තේරීම සඳහා මනා පද්ධතියක් හඳුන්වාදිය යුතුය.

- ඉරුම් මෝලෙන් ඇණවුම් කිරීමට පෙර පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ පවතින දැව තොග කර්මාන්ත ශාලාව විසින් පරීක්ෂා කළයුතුය.

- දැව ප්‍රමාණයන් හා වර්ග අනුව පිළියෙල කිරීමෙන් පසු පදම් කිරීමේ යන්ත්‍රයට ඉරූ දැව බෙදාහැරීම සඳහා ඉරුම් මෝලට විධිමත් සැලැස්මක් ලබාදිය යුතුය.

- කල්දෙමුල්ල කර්මාන්ත ශාලාව විසින් බාහිර කොන්ත්‍රාත්කරුවන්ට ඇණවුම් දිය යුත්තේ ශ්‍රමය හා යන්ත්‍ර පැය හිගය නිසා කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කළ නොහැකි අතිරික්ත ඇණවුම් ඇතොත් පමණි.

- නිශ්චිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කළමනාකාරීත්වය විසින් තරයේ පිළපැදිය යුතුය.

- යන්ත්‍රාගාරය ගැනද තත්ත්ව නිෂ්පාදනය කරන ලී බඩු උපකරණ මෙන්ම පිටස්තර කොන්ත්‍රාත්කරුවන් කරන වැඩ ගැනද තත්ව ආරක්ෂණ අත්දැකීම් ඇති සුදුසුකම් ලත් තත්ත්ව ආරක්ෂණ නිලධාරියෙකු පත්කර තත්ත්ව ආරක්ෂණ කාර්යයන් ස්ථාපනය කළයුතුය.

- බිම මතුපිට හෝ භූගත ජලය දූෂ්‍යවීම වැළැක්වීම සඳහා අපතයන් හා හදිසියේ සිදුවන මුදාහැරීම් රැස්කිරීමේ පහසුකම් සහිතව දැව ප්‍රතිකර්ම භූමි භාගය, ප්‍රතිකර්ම කරන ලද දැව ගබඩා භූමිය සහ කිල්තාර බැරල් ගබඩා කිරීමේ භූමි භාගය ඉතා හොඳින් සිමෙන්ති දමා සකස් කළයුතුය. තවද කල්තාර බැරල් ආරක්ෂිත ගබඩා සහිත ප්‍රදේශයක ගබඩා කළ යුතුය.

- ධූලි විමෝචනය පරිසරයට මුදාහැරීම විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. නැතහොත් නොසැලකිලිමත් ලෙස පරිසරයට මුදාහැරීමෙන් තොරව ලී කුඩු විකිණීමට පියවර ගතයුතුය.

- කර්මාන්ත ශාලාව ඇතුලට වාතාශ්‍රය හා ආලෝකය සැපයීමට පියවර ගතයුතු අතර සේවකයින්ට ආරක්ෂක ආම්පන්න සැපයිය යුතුය.

- යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ අපතයන් අවම කරගැනීම සඳහා එස්-5 ක්‍රමය හඳුන්වා දෙමින් අභාවිත යන්ත්‍ර සූත්‍ර , අභාවිත සංරචක, කොටසක් නිමි හා යල්පැන ගිය ලීබඩු උපකරණ කර්මාන්ත ශාලා පරිශ්‍රයෙන් ඉවත් කළයුතුය.

- විධිමත් ආකාරයෙන් නව පදම් කළ දැව ගබඩා කිරීම සඳහා ගබඩාවක් කළමනාකාරත්වය විසින් ඉදිකිරීම අවශ්‍ය වන අතර පදම් කිරීමේ යන්ත්‍රාගාරයේ තොග ලෙජරයක් පවත්වාගෙන යාමට විධිමත් පද්ධතියක් හඳුන්වාදීම අවශ්‍ය වේ.

- ඉන්වෙන්ට්‍රි ලබාගැනීම සඳහා විධිමත් තොග වාර්තා පවත්වාගත යුතුය. එක් එක් ගබඩා පිහිටි ස්ථානවල යම් විශේෂිත කාල පරිච්ඡේදයක් අවසානයේදී විගණකයින්ද නිර්ක්ෂකයන් වශයෙන් සහභාගී කරවාගෙන භෞතික තොග සත්‍යාක්ෂණය සිදු කළයුතුය. අනතුරුව තොග වාර්තා භෞතික තොගය පෙන්නුම් කෙරෙන පරිදි ගැලපිය යුතුය.

- කොටසක් පමණක් නිමි ද්‍රව්‍ය කෙරිගෙන යන වැඩවල කොටසක් ලෙස අගය කළයුතුය.

- ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර ප්‍රත්‍යාගණනය කර වර්තමාන වෙළඳ පොළ අගය ගිණුම් පොත්වලට ගැනීමට වහා පියවර ගතයුතුය.

**<u>රාජ්‍ය දැව සංස්ථා ප්‍රතිචාරය</u>**

විගණකාධිපති මෙම වාර්තාවෙන් යෝජනාකර ඇති නිර්දේශවලට පිළියම් යෙදීමට සංස්ථාව නිසි ක්‍රියාමාර්ග ගන්නා බවට සටහන් කර ගතිමු. යොදාගත හැකි අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට දැනටමත් පියවර ගෙන ඇති බවද දන්වා සරීමට කැමැත්තෙමු.

කල්දෙමුල්ල ලීබඩු නිෂ්පාදන යන්ත්‍රාගාරයේ කටයුතු පිළිබඳව කරන ලද මෙම කාර්ය සාධන විගණනය සම්බන්ධයෙන් සහ කල්දෙමුල්ල සංකීර්ණයේ ඵලදායිත්වය හා ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඔබ විසින් කරන ලද වටිනා නිර්දේශ ගැන නැවත වරක් අපගේ ස්තූතිය පල කර සිටිමු.

**<u>සංකේත නාමය</u>**

රා.දැ.සංස්ථාව - රාජ්‍ය දැව සංස්ථාව